චුස්සී ගෙස්

අර්කාදි ගයිදර්

චූක් සහ ගෙක්

කර්තෘ

අර්කාදි ගයිදර්

අනුවාදක:

තෙන්නකෝන් ජයදුව
(එම්. ඒ. මොස්කව්)

1984 මැයි

ප්‍රකාශනය:

කුරුළු පොත්

බෙදාහැරීම :

ප්‍රදීප ප්‍රකාශකයෝ

මුද්‍රණය:

චතුර මුද්‍රණ

3, ආනන්ද මෛත්‍රිය මාවත

මහරගම.

කතුවරයා ගැන.....

පුංචි ඔබ වෙනුවෙන් මා සිංහලට පෙරලූ මේ කතාව ලියා ඇත්තේ අර්කාදි ගයිදර් නම් රුසියන් ගත් කතුවරයායි. මේ කථාන්තරය ලියා තිබෙන්නේ ඒ රටේ ළමයින් වෙනුවෙන් පමණක් නොවෙයි, ලෝකයේ හැමරටකම ළමයින්ට කියවා රස විඳින්නටයි.

අර්කාදි ගයිදර් මේ කතාවේ එන ළමයින් දෙන්නාගේ ගතිගුණ කිසි මවාපෑමක් නැතිව ඇතිසැටියෙන්ම විස්තර කර තිබෙනවා. ඔවුන්ගේ පොඩි පොඩි දහකාරකම් අතරට තියෙන හොඳ ගුණත් අපූරුවට පෙන්වාදී තිබෙනවා. අම්මාට තාත්තාට ඇති ලොකු ආදරයත්, තමාගේ රටට තියෙන ඇල්මත් ඉන් දෙකක්.

මේ කථාන්තරයේ කියවෙන වැඩිහිටියන් ගැන විස්තරද කර තිබෙන්නේ ඇති සැටියෙන්මය. ඔවුන්ගේ හොඳ ගතිද මේ කථාවෙන් පෙනෙනවා. ඒ හැම කෙනෙක්ම කරුණාවන්තයි. අනුන්ට උදව් කරන්ට කැමතියි. නිහතමානියි. මෙහි කියැවෙන 'තාත්තා' උසස් රැකියාවක් කරන්නෙක්. ඒත් මූරකාරයා, කරත්තකාරයා වගේ සාමාන්‍ය මිනිසුන් හා මේ කථාන්තරයේ සඳහන්වන අම්මා ඒ තරම් දුර ගමනක් යන්නේ පුංචි ළමයින් දෙන්නා පමණක් සමඟයි. ඒත් යොරසතුරු බියක් වැනි දෙයක් ඒ කොහිදීවත් ඇයටවත් ළමයින්ටවත් දැනෙන්නේ නැත. ඇ නාදුනන කරත්ත කාරයාත් මූරකාරයාත් අම්මාටත් ළමයින්ටත් සලකන්නේ ඉතා සුහද ලෙසයි. ඔවුන් වංචාවක් කරයියන සැකයක් හෝ බියක් අම්මා තුලකිසිදුක ඇති නොවෙයි.

මේ කාරණා වලින් පෙන්වන්නේ එරටේ (සෝවියට් දේශයේ) ඇති සමාජයේ කැපී පෙනෙන ලක්ෂණයක්. එනම් අසල් වැසියන් ඇතුලු සියලු දෙනා හිතවතුන් හා මිත්‍රයන් ලෙස ක්‍රියා කරණ ආකාරයයි.

මෙවැනි හොඳ ගති එරට මිනිසුන් අතර ඇතිවී තිබෙන්නේ එහි ඇති සමාජ ක්‍රමය නිසා බවද අපි දැනගත යුතුයි. ඔවුන් අතර පරතරයක් පෙනෙන්ට නැත. ළපටියන්ට පමණක් නොව වැඩිහිටියන්ටද මේ කථාව කියවීමට යුදුසු වන්නේ මේ කාරණා නිසාය.

අර්කාදි ගයිදර් උපන්නේ 1904, රුසියාවේ අර්සාමාස් නම්පුංචි නගරයක. මෙය පරණ වියියක නගරයක්. එහි පල්ලි විශාල ගණනක් තිබුණා, මේ පල්ලිවල තිබුණු දේව රූප වල බොහෝ හාස්කම් තිබෙන බව මිනිස්සු කීවත් පුංචි ගයිදර්ගේ ඇස් ඉදිරිපිට මෙවා එකක්වත් සිද්ධවුණේ නෑ. මේවා ඒ නගරයේ සිටි මිනිසුන්ගේ මිත්‍යා විශ්වාස නිසා ඇතිවුණු කටකතා පමණක් බව පසුව ඔහුට දැනගන්ට ලැබුණා.

ගයිදර්ට වයස අවුරුදු දහයක්වූ විට ඔහුගේ පියාට දිග කාලයකට යුද්ධ හමුදාවට බැඳෙන්න සිද්ධවුණා. ඊට පසු ඔහුට පියා දකින්ට ලැබුණේත් කලාතුරකින්.

ගයිදර්ට ළමා කාලයේදී බොහෝ දුක් කරදර විඳින්ට සිදුවී තිබෙනවා. ඔහුට තමන්ගේ නෑදෑ මිතුරන් තමා ඇස් ඉදිරිපිටම මැරෙන හැටි දකින්ට සිදුවුණා.

ඔහු ළමා කතා ලියූ ගත්කතුවරයෙක් පමණක් නොව රටු වෙනුවෙන් සටන් කළ නිර්භීත යුද සෙබලෙක් ඔහු මලේද යුද බිමෙමයි ළමයින්ට ඇති විශාල ආදරය, ළමයින් ඇසුරු කිරීමට ඇති කැමැත්ත තව් ඔහුගේ කැපී පෙණෙන ගුණාංගයි. ළමා කතා ලියද්දි ඔහු කවදාවත් හරයක් නැති පුදුම සුරංගනා කතා ගොතන්ට කැමති වුණේ නැහැ. මේ කාරණය නිසා ඔහු අනෙක් සමහර ළමා කතා කාරයින්ට වඩා වෙනස් වුනා.

ගයිදර් ලියා ඇති අනෙකුත් කතා වලින් කීපයක් නම් ''පාසල'' ''බෙර කාරයකුගේ ඉරණම'' ''නිල්කෝප්පය'' සහ ''තිවුර් සහ පිරිස, ය මේ කථාවලින් බොහොමයක් ලෝකයේ නොයෙක් රටවල ළමයින් අතර ජනප්‍රියයි.

''චුක් සහ හෙක්'' නැමැති මේ කතාව මා අප රටේ දරුදැරියන්ට කියවීමට පිළිගන්වන්නේ ඉතා සතුටින්ය.

තෙන්නකෝන් ජයසුමන
මහවත්ත,
මැටිකොටුමුල්ල,
එස්සැල්ල.

එක්ක කාලයක චුක් සහ ගෙක් කියා පුංචි ළමයි දෙන්නෙක් හිටියා. මේ දෙන්නා අම්මාත් සමග වාසය කළේ ඉතා ඈත විසාල නගරයකයි. ඒ වාගේ ලස්සන නගරයක් ලෝකේ වෙන කොහේවත් නෑ.

ඊ දවල් දෙකේම ඒ නගරයේ මන්දිරවල කොන් අග රතුපාට කාරකා බබලනවා. ඇත්තෙන්ම ඒ නගරයට කියන්නෙ මොස්කව් කියාගයි.

මේ ළමයින් ගේ තාත්තා හිටියේ "නිල් කඳු වැටිය" ලඟ මහා වනාන්තරයක. එයාට එහේ කරන්ට බොහෝම වැඩ තිබුණා. ඒවා කොහොමවත් ඉවර කර ගන්ට බැරි වුණ නිසා නිවාඩුවට ගෙදර ඇවිත් යන්ට වත් ඉඩක් ලැබුණේ නෑ.

ඉතින් අන්තිමේ දී සීත කාලයත් ආවට පස්සේ එයාට එහේ ඉන්ද බැරී තරම් පාළුවක් දනුණා. එනැන ප්‍රධානීන් ගෙන් අවසර ඉල්ලාගෙන භාර්යාවට ලියුමක් ලිවා, ළමයිනුත් එක්කඑහාට එන්නට කියා.

ඉතින් තාත්තා එවූ ලියුමත් රැගෙන තැපැල් කාරයා තරප්පු පෙළ නැගගෙන එන වෙලාවේ චුක් සහ ගෙක් පුංචි කෝලාහලයක් කරමිනුයි හිටියේ කොටින් කියනවා නම් ඔවුන් ඒ වෙලාවේ හිටියේ කෑ ගහමින් හා ගුටි ඇන ගනිමින්.

මේ දබරය කොහොමද ඇතිවුණේ කියා ඔට දැන් මතක නැහැ. නමුත් මට හිතෙනවා එක්කෝ චුක් ගෙක් ගෙන් හිස් ගිණිපෙට්ටියක් උදුරා ගන්ට ඇති, නැතිනම් ගෙක් චුක් ගේ අතේ තිබුණු සපත්තු පොලිෂ් බෙලෙක්කයක් උදුරා ගන්නට ඇති.

ඉතින් ඒ අයියත් මල්ලිත් මිට මොලවා ගෙන එක එක ගුටිය බැගින් හුවමාරු කරගෙන, දෙවනි වතාවටද ගුටි ඇන ගැනීමට සූදානම් වෙන කොටම දෙරේ ඔහුව වැදුනා. ළමයින් දෙන්නා බයින් හැරී බැලුවේ අම්මා ඇවිත් කියාගයි. ඒ අම්මා හරිම පුදුම ගතිගුණ ඇති

අම්මා කෙනෙක් ළමයින් රෑඩු වෙන වෙලාවට එයා බැන්නේවත් හයියෙන් කෑ ගැවේවත් නෑ. එයා කරන්නේ කෝලාහල කාරයෝ දෙන්නා කාමර දෙකකට දලා දෙරවල් වලඩ යතුරු දනවා පමණයි. පැයක්ම එහෙම ඉන්ට අරිනවා. ඉතින් පැය දෙකක්ම වෙන්ටත් බැරි නෑ. දෙන්නාට හුඟ වේලාවකට එකට සෙල්ලම් කරන්ට බැරි වෙන්ටයි එහෙම කරන්නෙ. ''ටික්...ටික්...ටික්'' කිය කියා පැයක් ගත වෙන්ට කොච්චර වෙලා යනවද? පැයකට මිනිත්තු හැටක්. පැය දෙකට එයට වඩා කොච්චර වැඩි ද?

ඔන්න ඔය නිසයි අයියත් මලයාත් කඳුළු පිහ දමාගෙන දෙර අරින්ට දිව්වෙ.

ඒත් බැලින්නම් ඒ අම්මා නොවේ. කැපැල් කාරයා ලියුම්ක් අරගෙන ඇවිත්.

එතකොට ළමයි මහ හයියෙන් කෑ ගාන්ට උණා.

''මේක නම් තාත්තා එවලා තියෙන්නේ! ඔව් ඔව් තාත්තා එවපු ලියුම්ක් තමා මේක! තාත්තා බාගදට මෙහේ එනවත් ඇති.''

ළමයි සන්තෝෂයෙන් දිවාන උඩ පෙරලෙන්ටත් පනින්ටත් පිනම් ගහන්ටත් පටන් ගත්තා. ඒ මොකද? ලෝකෙන්ම ලස්සන නගරය මොස්කව් බව හැබෑ වුනත් තාත්තා අවුරුද්දකින් විතර ගෙදර නාවොත් මොස්කව් නගරය වුණත් පාළු තැනක් වෙන්ට පුලුවන්.

ඉතින් එහෙම සන්තෝස වෙවී ඉන්දෙද්දී අම්මා ආ බවක් වත් ඔවුන්ට ඇහුණේ නෑ.

අම්මා හරියට පුදුම වුණා. එයාගේ හොඳ පුතුන් දෙන්නා උඩු බැල්ලෙන් ඉඳගෙන බිත්තියට ඉපයින් අනිනවා. දිවාන උඩින් බිත්තියේ ඒල්ලා ඇති පින්තූර 'සට සට' ගා හෙල්ලෙනවා! බිත්ති ඔරලෝසුවේ දුන්න 'ටින් ටින්' ගා හෙලවෙනවා.[1]

මෙතරම් ලොකු සන්තෝසයකට හේතුව මොකද කියා දැනගත් විට අම්මා බැන්නේ නෑ. දෙන්නාටම දිවානෙන් නැගිටින්ට කීවා.

---

1 ඒ රටේ තට්ටු ගෙවල්වල මැද බිත්ති සාදා ඇත්තේ පිදුරු හා බදම මිශ්‍රණයකින් බොහොම තුනීව

හණික හිම කබාය ගලවා දැමූ අම්මා ලියුම අතට ගත්තා. එයා ඇගේ හිසකෙස් වල තිබුණු හිම පුපුරු පිහ දැම්මෙවත් නෑ. ඒ හිම දියවී ඇගේ කළු ඇඟි බැමේ රිදී තරු වගේ බැබලුණා.

කණගාටුදායක ලියුම්ද ප්‍රීතිදායක ලියුම්ද තිබෙන බව කවුරුත් දන්නවා. මේ ලියුම ඒ කොයි වර්ගයේ එකක්ද දැනගන්න චුක් සහ ගෙක් අම්මා ගේ මුහුණ දිහා විමසිල්ලෙන් බලා හිටියා.

මුලින්ම අම්මා නළල රැලි කළා. ළමයි දෙන්නත් නළල රැලි කළා. ඊලඟට අම්මා හිටා වුනා. ලියුම ප්‍රීතිමත් එකක් වෙන්ට ඕනෑ බව ළමයින් දැන ගත්තා.

"තාත්ත ගෙදර එනවා කියල නම් නෑ. තාත්තට තව එහෙ බොහොම වැඩ තියෙනවලු. වැඩ වල ඉවරයක් නැති නිසා එයාට ගෙදර එන්න පුළුවන් කමක් නැහිලු." යයි අම්මා කිවා.

රැවටුණු ළමයින් දෙන්නා සැකයෙන් හා දෙගිඩියාවෙන් එකිනෙකා දිහා බැලුවා. ලියුම කලින් හිතූ විදියේ සතුටු එකක් නොවන බව පෙනී ගියා.

ළමයින් දෙන්නා තදින් හුස්ම හෙලන්ට පටන් ගත්තා. අම්මා දිහා තරහින් වගේ රවා බලන්ටු පටන් ගත්තා. ඒත් අම්මා ඒ ගොල්ල නොදන්න කාරණයක් නිසා සිනාසෙනවා.

"තාත්තා මෙහේ එන්නෙ නැ කියනවා අපිට එහාට යන්ටලු." අම්මා අන්තිමට කීවා.

"තාත්තා හරි පුදුම එක්කෙනෙක්! එන්ටු කියන එක නම් ලේසියි හරියට විදුලි රියේ නැගිලා යන්ටු පුළුවන් වගේ" අම්මා සුසුම් හෙලමින් කීවා.

"ඔව් ඔව් තාත්තා යන්ඩ කියනවා නම් අපි විදුලි රියේ නැගිලා යමු" යයි චුක් කීවා.

"පුතා හරි මෝඩයෙක්. එහාට හැතැප්ම හයයියයක් විතර කෝච්චියෙන් යන්ට ඕනෑ. එතැන ඉඳලා තව හයසියයක් විතර හිම කරක්ක යෙන් තයිගා වනාන්තරය[2] හරහා යන්ට තියෙනවා. මේක හරිම

---

[2] උතුරු යුරෝපයේ සහ උතුරු ආසියාවේ ඇති ඝන වනාන්තර වර්ගයක්

පුදුම වැඩක්නේ. පුනාලම හිතල බලන්න මේ ගමන කොහොම එකක්ද කියා.''

ළමයි දෙන්නා විනාඩි බාගයක් වත් හිතා බැලුවේ නෑ. දෙන්නාම එක හඬින් කිව්වේ හැතැප්ම හයසියයක් චිතරක් නොව හැතැප්ම ලක්ෂයක් වුනත් යාමට එක පයින් ලෑස්ති බව. මේ දෙන්නා කිසිම දේකට බය නැති ළමයි. හරිම නිර්භීත කමක් හිතේ තියෙන්නේ. මිදුලට ආපු කාගෙද බල්ලෙක් ගල්වලින් ගහලා ඊයේ එලවලා දැම්මේ මේ ගොල්ලෝ තමා.

ඉතින් මේ ළමයි දෙන්නා බොහොම වෙලා මොන මොනවද කිව්වා. දැත් වන වනා මොනවාදෝ කිවා. උඩ පැන්නා අඩි හැප්පුවා. අම්මා මොකවත් නොකියා කරබාගෙන මේ ගොල්ලෝ කියන දේ අහගෙන උන්නා කරණ දේ බලා උන්නා.

ඒත් තාත්තා මෙහෙම ලියුමක් එවයි කියා අම්මා බොහෝ කාලයක ඉඳලා බලාපොරොත්තුවෙන් හිටියේ ළමයින් දෙන්නා මෙහෙම කලබල කලේ හිතලාමයි. එයා සමහර වෙලාවට විහිලු කරන්ටත් කැමති නිසා.

ගමනට සූදානම් වීමට අම්මාට සතියක්ම ගත වුණා. චුක් සහ ගෙක් ඒ අතරේ කාලය අපතේ හැරියේ නෑ. චුක් කැඩිවිටි පිහියකින් කින්ස්යක් හදා ගත්තා. ගෙක් ඇඳ නැති ලීයක් හොයාගෙන එයට ඇණයක් ගසා ගෙන හෙල්ලක් හදා ගත්තා. කොයි තරම් තියුණු කොයි තරම් ශක්තිමත් හෙල්ලක්ද කිව්වොත් වෙන ආයුධයකින් ටලහෙකුගේ හදවත මතු වෙන්ට තුවාල කරලා මේ හෙල්ලෙන් උගේ හදවතට ඇන්නොත් ඌ සැක නැතිවම එතැනම මැරි වැටෙනවා.

දැන් ඉතින් කවුරුත් ගමනට සූදානම් ගමනට ඕනෑ බඩු බෑග්වලට අහුරලාත් ඉවරයි. ගෙට හොරු පනිවි කියා දොරටු කවත් ඉබි යතුරක් දැමමා. රාක්ක වල ඉතුරු වෙලා තිබුණු පාන් කැලි, ඇටජාති, වෙනත් කෑම වර්ගවල ඉතිරි එවා හෙම අහකට අරන් දැමමා, මියෝ බෝවෙයි කියා.

ඉතින් ඔන්න අම්මා දුම්රිය පොලවට ගියා පහුවදා හවස කෝච්චියට ටිකට් ගෙන එන්න.

අම්මා නැති අතරේ චුක් සහ ගෙක් දබරයක් කරගත්තා. ඒ දබරය නිසා ඔවුන්ට කොයිතරම් කරදර වෙනවද කියා ඔවුන් දැනගෙන හිටියා

නම් කොතරම් හොඳ ද? එහෙනම් මේ ළමයි දෙන්නා එදා කොයිම දේ කට වත් රංඩු වෙන්නෙ නෑ.

දබරය ඇති වුනේ මෙහෙමයි:-

චුක් ලඟ තිබුණා හොඳ සිනිදු බෙලෙක් පෙට්ටියක්. එයාට බොහෝම වුවමනා කරන දේවල් මේ පෙට්ටියේ දමාගෙන තිබුණේ. තේ පැකට් වල සරුව පිත්තල කොළ, අහස් යානාවක හෝ රතු සොල්දාදුවෙකුගේ රූපයක් ඇති ටොපි කොළ, ඊ කුරු වෙනුවට පාවිච්චි කිරීමට කුරුළු පිහාටු, චීන විජ්ජා කිරීමට පාවිච්චි කිරීම සඳහා අස්ස ලොම් මෙවාත් තවත් උවමනා දේවලුත් මේ පෙට්ටියේ දමා-ගෙන එයා පරිස්සම් කළා.

ගෙක් වෙන විදිහක ළමයෙක් නිසා එයාට ඒවාගේ පෙට්ටියක් තිබුණේ නෑ. එයා සින්දු කීමට දක්ෂයෙක්.

චුක් තමාගේ ඒ වටිනා පෙට්ටිය පරිස්සම් කර තිබුණු තැනින් ගන්ට ගියා. ගෙක් සින්දු කියමින් ඉන්නවා එයාට ඇහුණා. ඒ වෙලාවෙම තැපැල් කාරයා ඇවිත් අම්මාට දෙන්ඩ කියා විදුලි පණිවුඩ-යක් චුක් ගේ අතට දුන්නා.

චුක් තමාගේ පෙට්ටියේ විදුලි පණිවුඩය දමා දැන් මල්ලී සින්දු කීම වෙනුවට කෑ ගහන්නේ මොකද කියා බලන්ට ගියා.

" රා! රා! හූරා! හූරා!

එයි! බෙයි තුරුම බෙයි! "

චුක් කාමරයේ දොර අරින විටු දැකපු දේට එයාට බොහොම තරහ ගියා.

කාමරය මැද්දේ පුටුවක් තිබුණා. පුටුව බාපතේ තිබුණා, එයාගේ හෙල්ලෙන් ඇනලා වැල් වැල් වෙන්ට ඉරූ පත්තරයක් ඒකේ ඇති වරදක් නෑ. ඒත් තක්කඩි ගෙක් දැන් ඉන්නේ අම්මා සපත්තු ගෙනා කඟපාට පෙට්ටියට හෙල්ලෙන් ඇන ඇන. එයා මෙහෙම කරන්නේ සපත්තු පෙට්ටිය වලහෙක් කියලා හිතාගෙනයි. ඒත් ඒ පෙට්ටිය අම්මා "චුක්" ටයි දීලා තිබුණේ. ඒකේ චුක්ගේ නලාවක්ද, ඔක්තෝම බර් උත්සවයේ පාට මැඩල් තුනක්ද, කොපෙක්[3] හතලිහක් ද තිබුණා.

---

[3] සෝවියට් දේශයේ භාවිතා කරණ මුදල් රුබල් එකෑයට කොපෙක් සියයයි.

එයා මේ මුදල් ගෙක් වගේ මෝඩ දේවල් වලට වියදම් කළේ නෑ. දුර ගමන යන කොට ප්‍රයෝජනයට ගන්ට පරිස්සම් කර තියා ගත්තා.

හිල් කරපු සපත්තු පෙට්ටිය දැකලා තරහ ගිය වුක්, ගෙක් ගෙන් හල්ල උදුරා ගෙන ඒක දනහිසට තියල දෙකට කඩලා විසි කළා. ගෙක් හරියට උකුස්සෙක් වගේ පැනලා මල්ලිගේ අතින් බෙලෙක් පෙට්ටිය උදුරාගන්න ජනෙල් පඩියට ගොඩවෙලා එක පාරටම ඒක මිදුලට විසි කළා.

මේකෙන් අමනාපයට පත් වුණු වුක් කෑ ගහන්ට පටන් ගත්තා.

"විදුලි පණිවුඩය, විදුලි පණිවුඩය ඒක ඇතුලේ!"

එයා විගහට හිම කබාය ඇදගෙන හිම සපත්තුවත් හිම තොප්පියවත් නැතිව මිදුලට බැස්සා.

ඇබැද්දියක් වෙච්ච බව දැනගත් ගෙක් ද අයියා ගියාට පස්සේ මිදුලට බැස්සා.

ඒත් පෙට්ටිය හෙව්මෙන් කිසිම පලක් උනේ නෑ. ඉතින් කාටවත් කියවන්ට නොලැබුණු විදුලි පණිවුඩයත් ඒ පෙට්ටිය ඇතුලේ.

ඒක හිම ගොඩකට වැටිලා යට ගියා ද? නැත්නම් පස්සේ වැටුණු හිම වලට යට වුනාද? ඒත් නැතිනම් පාරට වැටී පාරේ යන කෙනෙක් ඇහිඳ ගෙන ගියාද? මොනවා වුනත් ඇතුලේ තිබුණු දෙවදුන, විදුලි පණිවුඩයත් එක්ක පෙට්ටිය සදහටම නැති වුණා.

ගෙට ආ අයියයි මල්ලි දෙන්නා බොහොම වෙලා යනතුරු කිසි කතාවක් බහක් නැතිව හිටියා. අම්මාගෙන් දොන්නාටම වැඩේ වරදින බව දැනගත් ඒ ගොල්ලෝ දබරය එයින් නතර කරලා සමාදන වුනා. ගෙක්ට වඩා අවුරුද්දකටම වඩා වැඩිමල් වුක් මේ කරදරයෙන් ගැලවෙන උපායක් කල්පනා කළා.

"මල්ලි අපි අම්මාට විදුලි පණිවිඩෙ වහක් නොකියා උන්නොක් මොකද වෙන්නේ?" විදුලි පණිවුඩේ! ඒක මොකටද? අපට ඒක නැතුවට සතුටින් ඉන්ඩ බැරුවයැ" "බොරු කියන එක හොඳ නැහැ. අම්මා වැඩියෙන් කරහා බොරු කියනවට"

"අපි බොරු කියනවයැ?" යැයි වුක් ශ්‍රී නියෙන් කෑ ගැහුවා. "අම්මා ඇහුවොත් විදුලි පණිවුඩේ කෝ කියලා අපි කියමු. ඇහුවේ නැත්නම්

තොකියා ඉම්මු. ඇහුවේ නැති දේවල් කියන්නේ මොකටද? අපි කට වාවාලයෝ නෙමේනෙ."

" හා එහෙම නම් හොඳයි. බොරු කියන්ට වෙන්නේ නැත්නම් එහෙම කරමු. අයියාට එහෙම කරන්ට කල්පනා උන එක කොච්චර හොඳද?

මේ කාරණය ගැන චුක් සහ ශෙක් තීරණයකට බහිනවාත් එක්කම අම්මා ආවා. අම්මා ඒවෙලාවේ සතුටින් හිටියේ. මොකද? කෝච්චියේ හොඳම ආසන වලට ටිකට් ගන්ට පුළුවන් වුණු නිසයි. ඒත් එයා එක පාරටම දුක්කා එයාගේ ආදර පුත්තු දෙන්නා ගේ ඇඹුම් මූණුත්, රතු වෙච්ච ඇසුත්.

"ඉලන්දරි මා නැති වෙලාවේ මොකටද රණ්ඩු වුනේ කියනවා?" අම්මා හිම ගසා දමමින් ඇසුවා.

"අපි රණ්ඩු උනේ නෑ අම්මා" චුක් කීවා.

"ඔව් රණ්ඩු උනේ නෑ' රණ්ඩු වෙන්ඩ හදලත් ආයේ බෑ කියල හිතුණා"

"අන්න ඒවගේ හිතුවිලි වලට මං බොහොම කැමතියි" අම්මා කීවා

අම්මා හිම කබාය හෙම ගලවා දමලා දිවාන්නේ ඉදගෙන එය ගෙනාපු ගණකම ඇති කොළ පාට ටිකට් පෙන්නුවා ඒවායින් එකක් ලොකුයි. අනිත් දෙක පුංචියි.

ඉක්මනින් ඒ ගොල්ලෝ රෑ කෑම කාලා ලාම්පු නිමා දමලා නිදගත්තෑ.

වීදුලි පණිවුඩය ගැන අම්මා කිසි දෙයක් දන්නෙ නෑ නේ ඉතින් ඒ නිසා එයා ඒ ගැන මොකවත් ඇහුවේ නෑ.

පහුවදා හවස ඒ ගොල්ලෝ ගමන යන්ට පිටත් වුණා. කෝච්චිය පිටත් වෙන කොට රෑ වෙලා නිසා චුක්ටත් ගෙක්ටත් තමන් ආසා කරන කිසිම දෙයක් දැක ගන්ට බැරිවුණා. කෝච්චියේ ජනෙල්වලට එහා පැත්තෙ පෙනුනේ කළුම කළු පාටයි. රෑ ගෙක්ට වතුර තිබහක් ඇතිවෙලා අවදි වුණා. දැන් වහලයේ තිබුණු වීදුලි පහණ නිවා දමලා. අවට හැම තැනම නිල්පාට අඳුරු එළියක් පැතිරිලා තියෙන හැටි ගෙක්ට පෙණුනා. ඒ නිල්පාට එළිය එතන තිබුණු හැම දේකටම වැටිලා තිබුණා. පිරිසිදුරෙද්ද දමා තිබෙන ටීපෝව උඩ තියෙන වීදුරුව කෝච්චිය යන කොට හෙල වෙනවා. ඒ ලඟ තියෙන කහ

පාට දෙඩම් ගෙඩිය දැන් ටිකක් කොළපාටට හුරුව පෙනෙන්නේ. තද නින්දක සිටින අම්මාගේ මූණත් කෝච්චිය සෙලවෙන විට සෙල වෙනවා. ගෙත්තමක් වගේ අලංකාර විදියකට හිම බැඳිලා[4] තිබුණු වීදුරුව අතරින් ගෙක් හඳ දැක්කා. ඒක මොස්කව් නගරයේ කිසිදුක නොපෙනෙන තරම් විශාල හඳක්. දැන් කෝච්චිය යන්නේ බොහොම උස කඳු උඩින් බවත්, ඒ කඳු උඩ ඉඳලා හඳට වැඩි දුරක් නැති බවත් ගෙක්ට හිතුණා.

එයා අම්මා අතින් අල්ලා සොලවලා ඇහැරවලා බොන්ට දෙයක් ඉල්ලුවා. ඒත් එක් කාරණයක් නිසා අම්මා එයාට බොන්ට මොකුත් දුන්නේනෑ. වතුර තිබහට දෙඩම් ගෙඩියක් ලෙලි ඇරගෙන කන්ට කීවා.

ගෙක් මේකට අමනාප වුනා දැන් එයාට නිදාගන්ට නිදිමතත් නෑ. චුක් ඇහැරෙයිද බලන්ට එයාව තල්ලු කළා. චුක් නින්දෙන්ම තරහින් ඒ මේ අත ඇඹරුණා මිස අවදි වුණේ නැහැ.

ඉතින් ගෙක් සපත්තු දගෙන දෙරක් ඇරගෙන කොරිඩෝරයට ගියා කොරිඩෝරය පටුයි, දිගයි. ඒකේ තැනින් තැන පුංචි බංකු සවි කරලා තිබුණා. මේවා උඩ නිදගෙන නැගිටින්නා කොට ඒවා හඬ නගමින් ඇකිලෙනවා.

ගෙක් එක බංකුවක් උඩ හිඳ ගත්තා. නැගිට තවත් එකකින් ඉඳගත්තා. මෙහෙම බංකු උඩ ඉඳ ගනිමින් නැගිටිමින් කෝච්චි පෙට්ටියේ කොළඵරටම ගියා. එතකොට කෝච්චියේ ගාඩ මහත්තයා ලන්තෑරුමකුත් අරගෙන ඇවිත් ගෙක්ට දෙස් කීවා. "මිනිස්සු නිදි යෙද්දී එයා බංකු හප්ප හප්පා සබ්ද කරන්නේ ඇයි?" කියා ඇහුවා

මේ කොරිඩෝරයේම මැදිරි වලට යන තව දොරවල් දහයක් තියෙනවා. හැම දොරකම රකුපාට සායම් ගාලා ලස්සනට දිලිසෙනවා. දෙරේ යතුරු රත්රන් පාට්ට දිලිසෙනවා.

ගාඩ් යන්ට ගියා. ගෙක් හණික තමාගේ කාමරයට ගියා. එයා දෙර ඇර ගත්තේ බොහොම අමාරුවෙන්. අම්මාට ඇහැරේවි කියා බයින් බයින් දෙර වහලා මොලොක් මෙට්ටයට ගොඩ වෙලා පොරවා ගත්තා.

---

[4] ඒ රටවල සීත සෘතුවට වාතයේ තිබෙන ජල වාස්ප ජනෙල් වීදුරු වල මීදී අයිස් බවට පත්වේ.

ටිකක් මහත ඇහක් තියෙන එයාගේ අයියා ඉහෙදට අතපය දිග හැර නිදා ගෙන සිටි නිසා ගෙක්ට ඉඩමදි. එයා කිසිම ගරුසරුවක් නැතිව චුක්ට මීට මොලවා එකක් ඇන්නා ඊලඟ පස්සේ තල්ලු කළා.

ඒත් මේ සිද්ද වෙලා තියෙන්නේ මහා බය හිතෙන දෙයක! එතැන හිටියේ රත්රන් පාට ඉසකේ ඇති වටකුරු පුංචි ඔලුවක් ඇති එයාගෙ අයියා නොවේ. උඩු රැවුලක් තියෙන තරහගිය මූණක් තියෙන කවුද නාදුනන මාමා කෙනෙක් ගෙක් දිහා බලලා මෙහෙම ඇහුවා.

''කවුද මමහේ දහලන්නේ?''

එතකොට ගෙක් පුළුවන් හයියෙන් කෑගහන්ට පටන් ගත්තා. බයවුනු මිගින් හැම මැදිරියකම විදුලි පහන් දල්වලා යහන් වලින් බැස්සා.

වැරදීමකින් තමා වෙන මැදිරියකට ගිහින් තිබෙන වග දැන් ගෙක්ට තේරුණා. එයා ඒ නිසා වඩා හයියෙන් කෑගහන්ට පටන් ගත්තා.

දැන් ඔක්කෝම මිනිස්සු වෙව්ව දේ තේරිලා හයියෙන් හිනා වෙන්ට පටන් ගත්තා. රැවුල තියෙන මාමා එයාගේ කලිසම ඇඳ ගෙන ගෙක්ව එයාගේ මැදිරියට ගිහින් ඇරලුවා.

ගෙක් හොඳට පොරවාගෙන නිශ්ශබ්ද වුණා. එයාට සුළං හමන හඬ ඇසුණා, මැදිරිය ලතාවකට සෙලවෙන්ට වුණා. කවදවත් දැක නැති තරම් විසාල හඳ ආයෙත් ලා නිල් එළියක් පතුරුවන්ට පටන් ගත්තා. සුදු මියෝ රෙද්ද උඩ තිබුණු හෙලවෙන වීදුරුවත්, කහපාට දෙඩම් ගෙඩියත්, සූතාට වෙව්ව හදිය නොදැන නින්දෙන් හිනාවෙන අම්මාගේ මූණටත් මේ ලා නිල්පාට එලිය වැටී තිබුණා.

අන්තිමේදී ගෙක්ටත් නින්ද ගියා. එයාට දැන් හිනයක්ද පෙනෙන්ට වුනා.

පුදුම සිනයකි ඔහු දුටුවේ
දුවන දුම්රියට පණ ඇතිවේ
රෝදවලින් කට හඬක් ඇසේ
එක එක රෝදය කතා කෙරේ

කෝච්චි පෙට්ටි රැස පෙළට දුවනවා
ඇන්ජිම සමගින් කතා කරනවා,

පළමුවන පෙට්ටිය:-

දුවපන් යාළුවෙ ගමන දුරයි
වැටුණු හිමයි හැමතැන අඳුරයි

දෙවන පෙට්ටිය:-

දුම්රිය සහනේ එලි වෙනකන්
තව තව වැඩියෙන් එළිය දියන්

තුන්වන පෙට්ටිය:-

ගින්දර තව තව ඇවිලියන්
කෝච්චි ඇන්ජිම හූ කියපන්
බබහිර පැත්තට රෝද කැරකියන්

හතරවන පෙට්ටිය:-

නිල් කඳු අතරින් ගමන යමන්
අපගේ ගමනත් ඉන් ඉවරයි
කතා බහත් එතනින් ඉවරයි

ගෙක් අවදි වුණාට පස්සේ කෝච්චියේ රෝද කිසිම කතා බහක් නැතිව එක් ලතාවකට හෙළුවෙන හඬ දුම්රිය ඔදිරිය යටින් ඇහුණා. හීම බැඳුණු ජනෙල් විදුරුව අතරින් දැන් ඉර එළිය වැටුණා. කවුරුත් කවුරුත් නැගිට ඇඳ රෙදි සකස් කළා මුහුණ සෝදගත් වුක් ඇපල් ගෙඩියක් කන්ට පටන් ගත්තා. මේ අතර අම්මාත් උඩු රැවුල් ඇති සොල්දාදුවෙකුත් දෙර ලඟ හිට ගෙන ගෙක් එදා රැ ගිය සුදුම ගමන ගැන කතා කරමින් කොක් හඬලා (හයියෙන්) සිනා සුණා. වුක් යුද්ධ කාරයකු ගෙන් තමාට තැගි ලැබුණු කහපාට මුද්දක් ඇති පැන්සල ගෙක්ට එවේලේම පෙන්නුවා.

ඒත් ගෙක් කාගේවත් බඩු ගැන ඊර්ෂ්‍යා කළේ නැහැ. එයා වෙන විදිහක ළමයෙක්. එයා මහ රෑ වෙන මිනිස්සුන්ගේ කාමරයකට ගියා මදිවට දැන් තමන්ගේ කලිසම කියාපු තැනත් මතක නෑ. ඒ වුනත් ගෙක් සින්දු කියන්ට හපනෙක් නේ!

ගෙක් මුණ සෝදගෙන අම්මාට ''සුභ උදැසනක් වේවා[1] කියලා කීවා. එයා ඊට පස්සේ සීතල ජනෙල් විදුරුවට නලල හේත්තු කර ගෙන බලාගෙන හිටියා.

---

[1] සෝවියට් දේශයේ ගෙදර අයට වුනත් 'ආයුබෝවන්' කීම කවුරුත් කරණ දෙයක්.

මේ අතරේ වුක් හැම කාමරයකම දෙර ලඟට ගිහින් කෝච්චියේ ඉන්න මිනිස්සු එක්ක යාලු වුණා. ඒගොල්ලෝ වුක්ට කැමැත්තෙන්ම එක එක විදිහේ දේවල් දුන්නා:- එක් කෙනෙක් රබර් මූඩියක්, තව කෙනෙක් යකඩ ඇනයක්, තවත් කෙනෙක් ලස්සන රෙදි සම් කැල්ලක්. මේ අතරේ ගෙක් ජනේලයෙන් හුහක් දේවල් දැක්කා:-

මෙන්න කැලෑ බද ගෙයක්. ලොකු හිම සපත්තු දෙකක් දගෙන කමීසයක් විතරක් ඇඟලාගත් ළමයෙක් දෙරකඩට ආවා. එයාගේ අතේ බළලෙක්. දඩාස්! එක පාරටම බළලා පූළුන් වගේ සිහිදු සුදු හිම ගොඩට විසි වුණා. ඌ අමාරුවෙන් හිම ගොඩ උඩට පැන උඩ පනින්ට වුණා. (සිතල නිසා) ළමයා බළලාව එලියට විසි කළේ මොකද කියලා හිතන්ට ඕනෑ. බඟද ඌ මොනවාහරි හොරාකන්ඩ ඇති.

නමුත් දැන් ගෙයක්වත් ළමයෙක්වත් බළලෙක්වත් පෙනෙන්නවත් නෑ. පිට්ටනියක් මැද්දේ කම්හලක්.

හිම වැටිලා පිට්ටනිය සුදුම සුදුයි. කම්මලේ දුම් නළ රතුම රතු පාටයි. මේ කම්මලේ මොනවද හදන්නේ කියලා දන්නේ නෑ. මෙන්න කම්මලේ මුර පොල. බොහොම ලොකු හිම් කබායක් ඇඳ ගෙන මෙන්න මුරකාරයා ඉන්නවා. එයාගේ තුවක්කුව පෙනෙන්නෙ හරියම පිදුරු ගහක් තරම් හීනියටයි. (ඒත් එයා එක්ක කෝලාහල කරගන්ට ගියොත් මොකද වෙන්නේ කියලා බැලිය හැකි)

ඊට පස්සේ කැලෑව නටන්ට පටන් ගත්තා, ලඟ තිබුණු ගස් වඩා ඉක්මනින් නටනවා. ඇත තිබෙන ඒවා ඊට වැඩියෙ හෙමින් නටනවා හරියට ඒ ගස් සුදු හිම ගංගාවක පාපෙනටා වගේ පෙනෙන්නේ වටිනා බඩු ගොඩාක් අරගෙන ගෙක් එතෙන්ට ඇවිත් අයියාට කෑ. කළා. දෙන්නාම එකතු වෙලා ඒ බඩු මොනවද කියලා බලන්ට පටන් ගත්තා.

මේ දෙන්නාගේ හොඳට එළිය වැටුණු ලොකු දුවරිය පොලවල් අකින්නට ලැබුණා. මේ දුම්මීය පොලවල් වල ඇන්ජින් සිය ගණනක් 'හූ හූ' ගගා හඬ නගමින් දුම් දමමින් තිබුණා. මොස්කව් නගරයේ ඔවුන්ගේ ගේ ලඟ තිබුණු පුංචි කඩ පිල තරම් පුංචි දුම්රිය පොලවලුත් මේ අතර තිබුණා.

යපස්ද, ගල් අහුරුද, පෙට්ටියේ හරි අඩක් තරම් ලොකු ලී කොටද පැටවූ කෝච්චියක් ඒගොල්ලන්ට දකින්ට ලැබුණා.

ඊට පස්සේ හරක් පැටවූ කෝච්චියක්ද පෙනුණා මේ කෝච්චියේ ඇන්ජිම වෙන ඒවා වගේ ලස්සන නෑ. ඒකේ හූ හඬත් හුහක් හීන්. ඒකේ උන්නු එක ගොනෙක් "මූ" කියා කෑ ගහනවා ඇහුණා. මේ කෝච්චියේ රියැදුරා හැරිලා බැලුවා. ඛාගද ඒ චුක්ලාගේ කෝච්චියේ විසාල ඇන්ජිම තමන්ගේ ඇන්ජිම පහු කරගෙන යනවා දැකලා වෙන්ට ඇති.

එක් දුම්රිය පොලකදී ඒ ගොල්ලෝ ගිය කෝච්චිය යුද්ධ ආයුධ පැටවූ කෝච්චියක් ලග නතර කළා. ඉටි රෙදි වගයකින් වහලා තියෙන මේ ආයුධ පෙනෙන්නේ බය හිතෙන විදියකටයි. රතු සොල්දාදුවෝ පිරිසක් ඒ මේ අත සක්මන් කරමින් සිනාසෙමින් විනෝද යෙන් වගේ හිටියා. සීතල නිසා මේස් දුපු අත් පිරිමැද ගත්තා,

හම්වලින් හැදූ හිම කබායක් ඇඳ ගත් එක මිනිහෙක් මේ කෝච්චිය ලඟ කිසි කතා බහක් නැතිව කල්පනා කරකර බලාගෙන හිටියා. ඒ ඉන්නේ හමුදාවේ නායකයා වෙන්ට ඇති කියා චුක් සහ ගෙක් කල්පනා කළා. සැකයක් නැතිවම එයා මෙහෙම නිශ්ශබ්දව බලාගෙන ඉන්නේ සතුරන්ට වෙඩි තියන්ට වොරශිලෝප්[1] ආඥාව එනතුරු වෙන්ට ඇති.

මගදී ළමයි දෙන්නට හුහාක් දේවල් දකින්ට ලැබුණා. කණගාටු වකට කාරණයක් තියෙන්නේ එළිමහනේ සමහර වෙලාවට හිම කුණාටු ඇතිවීමත්, සමහර වෙලාවට ජනෙල් විදුරුවල හිම කවටු බැඳි තිබීමත්, එහෙම තියෙන කොට හොඳට එලිමහන පෙණෙන්නේ නැහැ.

ඔන්න අන්තිමට එදා උදේ ඒගොල්ලන්ගේ කෝච්චිය පුංචි දුම්රිය පොලක් ලඟ නැවැත්තුවා.

අම්මා චුක් සහ ගෙක් එක්ක කෝච්චියෙන් බැහැල බඩුත් ඛාගත් තාට පස්සේ කෝච්චිය ඉක්මනින් පිටත් වුණා.

---

[1] එකල සිවි සෝවියට් නායකයෙක්. පස්සේ ඔහු රුසියාවේ ජනාධිපති වුණා.

බැග් (ගමන් මලු) හැම තැනම එක වගේ තිබුණු හිම ගොඩක් උඩින්ම තිබ්බා. ලීවලින් හදපු දුම්රිය වේදිකාවේ හිටපු සෙනඟ ඉක්මනින් යන්ට ගියා. දැන් වේදිකාව හිස් වෙලා ගිහින්. ඒත් ඒගොල්ලෝ හමුවීමට බලාපොරොත්තුව හිටපු තාත්තා තවම එනතට ඇවිත් නෑ.

මේ වෙලාවෙදී තාත්තා ඇවිත් නැති එක ගැන අම්මාට සෑහ ආවා. බඩු ටික බලාගන්ට උදවු දෙන්නාට කියල හිම කරත්ත තියෙන කැනට ගිය, තාත්තා එවලා තියෙන හිම කරත්තය කොයි එකද දැන ගන්ට.

අම්මා බොහෝ වේලා යනතුරු ආපසු ආවේ නැහැ. මේ අතර කොහේදෝ ඉඳලා හුහක් බය හිතෙන විදිහේ එළුවෙක් වුක්ලා ලහට ආවා. ඉස්සරලා උෆ සීතල වෙලා තිබුණු බීරියෝස[1] ලීකොට වල පොකු උලා කන්ට පටන් ගත්තා. පස්සේ ඉතා අවලක්ෂණ විදිහකට කැගහලා බොහොම වුවමනාවෙන් වුක් සහ ගෙක් දිහා බලා හිටියා. වුක් සහ ගෙක් ඉක්මනට සූට්කේස් වලට මුවා වෙලා හැංගුනා. ඒ ඇයි? මේ පලාතේ එළුවෝ මොනාවා කරයිද කියා කව්ද දන්නේ?

ඔන්න ඉතින් අම්මා ආවා. එයා හිටියේ බොහොම කණගාටු වෙන් තාත්තාට ඒගොල්ල එන බව කියලා එවපු විදුලි පණිවුඩේ ලැබෙන්ට නැතිව ඇති බව ඈ කිවා; "එයා හිම කරත්තයක් දුම්රිය පොලට එවලා තැත්තේ ඒ නිසයි."

ඒගොල්ලෝ හිම කරත්ත කාරයකුට අඩගැසුවා. කරත්ත කාරයා එළුවාගේ පිටට දිග කසයෙන් පාරක් ගහලා, ඒගොල්ලන්ගේ ගමන් මලු ගෙන ගිහින් දුම්රිය පොලේ තේ කඩයෙන් තිබ්බා.

තේ කඩය පුංචියි. එතන වුක් තරම් ලොකු සම්භාරයක්[2] තිබුණා සම්භාරය ඇතුලේ වතුර පැහෙන විට ඒක ',පු පු" යනා ශබ්දයක් නග මින් වෙවුලුවා. ඒකෙන් සුදු වලාකුලක් වගේ වාෂ්ප පිටු වෙව් වහලය දිහාවට පැතුරුණා. ගේ කුරුළු රංචුවක් වහලේ යටට වෙලා' කිවිබිවි' කියා කැගසමින් ගිනි තපිනවා පෙනුනා.

---

1 ශීත රටවල ඇති සුදුපාට කඳ ඇති ගස් වර්ගයක්,
2 සෝවියට් දේශයේ භාවිතාවන කේතල් වර්ගයක්.

චුක් සහ ගෙක් තේවතුර බොන අතර අම්මා කරත්ත කාරයත් එක්ක ගණු දෙනු ගැන කතා කළා. මහ කැලෑව අතරින් කාත්තා ඉන්න තැනට යන්ට කොපමණ වුදලක් ඕනෑද කියා අම්මා ඇහුවා. කරත්ත කාරයා ඉල්ලුවේ ලොකු මුදලක්—ඒ කියන්නේ රුබල් සියයක්ම ඔව් ඇත්ත කියනවා නම් ගමන එතරම් කිට්ටු එකක් නොවේ, අන්තිමේදී ඒ දෙන්නා තීරණයකට ආවාට පස්සේ කරත්ත කාරයා ගමනට වුවමනා දේවල් (පාන්, පිදුරු, ගණකම ඇති හිම කබායක්) ගෙනෙන්ට ගෙදර ගියා.

,'කාත්තා දන්නේ නැතිව ඇති අපි ආ බවක්. ඉතින් එයා අපිව දැක්කාම පුදුම වෙයි, සතුටුත් වෙයි'' අම්මා කීවා,

''ඔව එයා සතුටු වෙයි තමා. එතකොට මමත් පුදුම වෙනවා. ඔම සතුටුත් වෙනවා'' කේ බොටින් සිටි චුක් මෙහෙම කීවේ ලොකු කෙනෙක් වගේ.

''මමත් එහෙමම සතුටු වෙනවා. අපි හෙමින් සිරුවේ ගේ ඇතුලට යමු. ඉතින් කාත්තා ගෙදර නැත්නම් අපි ගමන් මලු ටික හංගලා ඇඳ යටට රිංගා ගමුමු, ඉතින් කාත්තා ආවයි කියමුකෝ කාත්තා ඇවිත් ඉඳගෙන මොනව හරි කල්පනා කරයි. අපි ටිකක් වෙලා සද්ද නැතුව ඉඳලා එක පාරට හයියෙන් කෑගහමු''

මෙහෙම කීවේ ගෙක්.

''මම නම් ඇඳ යටට රිංගන්නෙත් නෑ කෑගහන්නෙත් නෑ. ඔයගොල්ලන්ට ඕනෑ නම් එහෙම කරන්න...ඒක නෙමේ චුක්, ඔයා මොකද ඔය සාක්කුවේ සිනි කැම හංගාගෙන ඉන්නේ. ඔයාගේ සාක්කුව හරියට කුණු කූඩයක් වගේ පිරිලානේ''යි අම්මා කිවා.

''මම ඒවා කියාගත්තේ අස්සයින්ට කවන්ඩ''යි චුක් කාරණය පැහැදිලි කර දුන්නා ඊට පස්සේ ගෙක්ට සැර කළා:—''ගෙක් ඔයාගේ සාක්කුවේ තියෙන බටර් පාන් කැල්ලක් එළියට ගන්ඩ. හැමදාම අම්මා අහන්නේ මගෙන් විතරයි.''

ටික වෙලාවකින් කරත්තකාරයා ආපහු ඇවිත් ගමනට සූදානම් වුණා. හොඳට ඉඩකඩ තියෙන හිම කරත්තය උඩින් ගමන් මලු

නිබ්බ: පිදුරුත් ඒකට දැම්මා. හැමෝම ගණුකම් ගිමකබා ඇඳගෙන' ඒවාගේම ගණුකම් ලෝම ඇතිරිලි පොරවා ගත්තා.

පිඟාල නගර වලටත්, කම්හල් වලටත් දුම්රිය පොලවල් වලටත් ගම්මානවලටත් සෙයිලම් වලටත් ඉහින් ආයුබෝවන්! දැන් ඉහින් ඉදිරියටා තියෙන්නේ වනාන්තරයත් කඳුත් පමණයි, ඉන් එහාට තියෙන්නෙත් අඳුරු ගනකැලෑව පමණයි.

ඉර බහින්ට කිට්ටුවෙන තුරුම ඔවුන් අඳුරු තයිගා වනාන්තරය අතරින් ඇනුම් අරිමින්, නිදිකිරමින් හා වෙහෙස වෙමින් ගමන්කළා. නොදැනුවත්වම වාගේ යන තැනට කිට්ටුවුණා. කරත්තකාරයාගේ පිටව වැහීගිය පාර වුක්ට හරියට පෙනුණේ නැහැ. එයාව් කම්මැලි ගිතුණේ ඒ නිසයි. අම්මාගෙන් බනිස් ගෙඩියක් හෝ රසකැවිල්ලක් ඉල්ලුවාම අම්මා ඒවා දුන්නෙත් නෑ. ඉහින් එයාට වෙන කරන්ව දෙයක් නැතුව ගෙක්ව අයිනට තල්ලු කරන්ට පටන් ගත්තා.

මුලදී ගෙක් ඉවසිල්ලෙන් තල්ල නොවී හිටියා. පස්සේ බැරිම තැන වුක්ගේ ඇඟව කෙළ ගැහුවා. වුක්ටත් දැන් හරියට තරහ ගිහින් දැන් දෙන්නා කෝලාහල කරන්ට පටන් ගත්තා. ඒත් දෙන්නම ගණ ගිමකබා ඇඳගෙන සිටි නිසා ගුටි ඇනගන්ට බැරී වුණා. පුළුවන් වුණු එකම දෙය දෙන්නට දෙන්නා නලල් වලින් තල්ලු කර ගැනීමයි.

මේ දෙන්නා කරන දේ දැකලා අම්මාට හරිම හිනා! කරත්ත කාරයා අස්සයින්ට කසෙන් පාර දෙක තුනක් ගැහුවා. සුදුසාව පුළුන් වගේ හාවෝ ඔදන්නෙක් පාරට පැනල සෙල්ලම් කරන්ට වුණා. කරත්තකාරයා එතඉකාට හයියෙන් කෑගැහුවා:—

"ඒයි! ඒයි! ඔහෝ!—හෝ! අයින් වෙයල්ලා. අයින් වෙයල්ලා. උඹලා කරත්තෙට අහුවෙයි."

සෙල්ලක්කාර හාවෝ දෙන්නා දහකාර විදියකට කැලේට ටිංගා ගත්තා. මූණට පිරිසිදු සුලං හමනවා දැනුණා. ශීතල නිසා අකැමැත්තෙන් ඔුනත් වුක් සහ ගෙක් දෙන්නට දෙන්නා තුරුලු වුණා. ඒ ගොල්ල තයිගා වනාන්තරේ තව තව ඇතට යනවා. නීල් කදු වැටිය දැන් එච්චර ඇත නෑ හඳත් පායාගෙන එනවා.

දැන් කිසිම අනක් නැතිව කිකරු අස්සයෝ දෙන්නා වහලය හිමෙන් වැහිලාගිය පුංචි පැලක් ලඟට ඇවිත් නතර වුණා.

''රෑට මෙතන ඉම්මු, මේක අපේ නවාතැන''යි කරත්තකාරයා හීමෙන් වැහිගිය බීමට බහිමින් කීවා.

පැල පූංචි උනත් හොඳට සවීසක්තීය තියෙනවා. ඒක ඇතුලේ කවුරුවත් හිටියේ නෑ.

කරත්තකාරයා ඉක්මනින් කේතලය ලිපේ තියලා වතුර රත්කලා. ඊට පස්සේ හිම කරත්තයේ තිබුණු කෑම මල්ල ගෙනාවා.

කල්බසා[1] කොතරම් සීතල වෙලාද කිව්වොත් ඒවා ඇණ ගහන්ට පුළුවන් තරම් හයියයි. ඒවා වාෂ්ප වලට අල්ලලා රත්කලා, පාන්, කැටියකට දලා රත් කලා.

ලිප ලඟ කීබිලා ඇදවී ගිය කම්බි දුන්නක් වුක්ට හම්බ වුණා. කරත්තකාරයා කීවේ ඒක සතුන්ට අටවන උගුලක කැල්ලක් කියලා. ඔල බැඳව්ව මේ කම්බි කැල්ලෙන් කාටවත්වැඩක් නැති නිසා ඒක වුක් තියාගත්තා.

තේ බීලා ටික වෙලාවකට පස්සේ රෑ කෑම හෙම කාලා ඒ ගොල්ලෝ නිද ගත්තා. බිත්තිය ලඟ දිග පළල ඇඳක් තිබුණා. මේ විටයක් වෙනුවට ඒකේ අතුරලා තිබුණේ වියලි කොළ.

ගෙක් බිත්තිය ලඟවත් මැදින්වත් නිදගන්ට කැමති නෑ. එයා පුංචි කාලේ ඉඳලා මෙහෙම කවියක් අහලා තියෙනවා.

''බයි බයි බයිය බබා
අයිනේ දෙයියන්න එපා.'

ඒවුනත් ගෙක් හැමදම අයිනේ මයි නිදගන්නේ.

එයා මැද්දේ නිදි කෙරෙව්වොත් පොරවන රෙද්දත් අහක් කර ගෙන නීන්දෙන් දැත්වලින් වුක්ට අනින්ටත්, දනගිස්වලින් එයාව කල්ලු කරන්ටත් පටන් ගන්නවා,

---

[1] මස්වලින් සාදන ලිංගුස්වලට සමාන රුසියන් ආහාරයක්.

කරත්තකාරයා ඉටිපන්දම නිවාදලා උදුන උඩට නැග්ගා නිදා ගත්තා.

අදත් වෙනදා වාගෙම මහ රෑ ගෙක්ට වතුර තිබ්බක් හැදිලා අවදි වුණා. අඩ අඳුරේම හිම සපත්තු දගෙන එයා කේතලයෙන් වතුර ටිකක් බීලා ජනේලය ලඟට ගිහින් ඉඳගත්තා.

හඳ වලාකුළු අතර ගිලී තිබුණා. අඳුර නිසා පුංචි ජනේලය අතරින් හිම ගොඩවල් පෙනුණේ අඳුරු නිල්පාටකට.

''ඉතින් අපේ තාත්තා ඉන්නේ කොච්චර ඇතද? මීටත් වඩා ඈත තැන් ලෝකේ තියෙනව නම් ඒ බොහොම ටිකයි.'' ගෙක් පුදුමයෙන් හිතන්ට වුණා.

දැන් ගෙක් හොඳට කන්දිහා බලනවා. එයාට ජනේලයෙන් එහා පැත්තේ මොකක් හරි හැප්පෙනවා වගේ හඬක් ඇහුණා. ඒක හැප්පෙන හඬක්මත් නොවේ. හිම උඩින් මොකෙක්ද බර අඩි තියන ශබ්දයක් ඔන්න ඊලඟට අඳරේ ඉඳගෙන මොකෙක්ද සතෙක් මහා බර හුස්මක් හෙලුවා. මොනවද සෙලවෙනවා වාගෙත් ඇහුණා. දැන් ගෙක්ම තේරුණා මේ ජනේලය ලඟින් වලහෙක් ගිය බව.

''නපුරු වලසෝ උඹ මොකටද මෙතෙන්ට ආවේ. අපි බොහොම ඇත ඉඳලා අපේ තාත්තා හොයන්ට ඇවිත් ඉන්නේ. ඉතින් උඹට ඕනෑ වෙලා තියෙනව අපව මරලා කන්ට. එතකොට අපව කවදාවත් තාත්තව දකින්ඩ හම්බවෙන්නේ නෑ. වලසෝ හොඳ හිතින් පලයන් නැත්නම් මිනිස්සු උඹව වෙඩිතියලා හරි හෙල්ලෙන් ඇනලාහරි මරයි.''

ගෙක් මෙහෙම හිතමින් තොල් මැතුරුවා. බයින් හා සැකයෙන් හිම බැඳුණු ජනෙල් වීදුරුවට තවතවත් කිට්ටුවී ඒකට නලල හේත්තු කෙරුවා.

දැන් ඉක්මන් ගමන් යන වලාකුලු අතරේ සැහැවී තිබුණු හඳ එළි යට ආවා. අඳුරු නිල්පාට හිම ගොඩවල් අඳුරු එළියකින් යම්තම් දිලිසුණා. ගෙක් එතකොටයි දැක්කේ ඒ වලහෙක් නොවන වග. ඒ අස්සයා හිම ගොඩවල් වටේට හක්මත් කරටික් පිදුරු කනවා.

අස්සයාට වළහෙක් කියලා රැවටුන එක ගැන ගෙක්ගේ හිතට හරි නැහැ. එයා ඇඳට වෙලා හොඳට පොරවා ගත්තා. ඉතින් එයා බයානක දේවල් ගැනම හිත හිත උන්නු නිසා එයාට නපුරු හීනයක් මෙණුනා.

පුදුම හීනයකි ඔහු මේවර දුටු — වේ
බියකරු රකුසු මිනිහෙක් එතැනින් මතු — වේ
කේතලයකින් හැලෙනා උණු වතුර — වගේ
කෙළ වැගිරී ගලායයි තොල්වලින් — උගේ

පිය සටහන්ය හිම මත ගින්දරද — පෙනේ
හැම දෙන මරා දැමුමට අරඅදිණු — පෙනේ
දුර බැහැරින් මෙහි ආ සෙබලුන් — පේලි
ඉදිරියටම යනවා දැන් පෙළ — පාලී

මේ හැම අසුබ ලකුණුයි නපුරු දේවලු — යි
පැසිස්ට් කාරයින්ගේ[1] සස්කික කොඩිය — යි
බිය ගන්වමින් ගත සිත නිසල කර — කර
පෙනුණා ඔහුට හීනෙන් එද මේ — යුර

"නතර වෙයල්ලා! නතර වෙයල්ලා උඹලා මෙහේ එන්ට එපා! උඹලට මෙහේ ඒම තහනම්!" ගෙක් ඔවුන්ට කැගහලා කිව්වා.

ඒත් ඒ කවුරුවත් ගෙක්ට කන් දුන්නේ නැහැ.

---

[1] තමන්ගේ ජාතිය පමණක් උසස් යයි සලකමින් අනිත් හැම ජාතියක්ම යටත් කිරීමට තමන්ට අයිතියක් තිබෙ යයි සිතූ නායකයින් කොටසක් ඉතාලියේ ඇතිවුනා. පස්සේ මේ අදහස්ම ඇති නායකයින් ජර්මනියේද ඇති වුණා. මේ අය හිට්ලර්ගේ නායකත්වය යටතේ ලෝකයේ අනිත් රටවල් යටත් කර ගන්ට උපක්‍රම යෙදුවා. ඔවුන් අල්ලාගත් රටවල මිනිසුන්ට ඉතා භරක ලෙස වධ දුන්නා. මේ අය සෝවියට් දේශයද ආක්‍රමණය කළා. රුසියන් ජනයා ඔවුන්ට විරුද්ධව විරෝදර සටනක් කර ඔවුන් පරාජය කළා. මේ කතාවේ කියන චුක් සහ ගෙක් කියන පුංචි ළමයි දෙන්නා අවා පැසිස්ට් කාරයින්ට වෛර කරනවා.

කරහෙන් පිපිරෙන්ට ඩුනු ගෙක් එතකොට වුක්ගේ සපත්තු ෂෙව් ටිය ඇරලා ඒකේ තිබුණු නලාව අරගෙන හයියෙන් පිම්බා. කොච්චර හයියෙන් පිම්බාද කියනවා නම් එදා කෝච්චිය ලඟ කල්පනා කරමින් හිටිය හමුදා නායකයා හිස ඔසවලා බැලුවා, අත වැනුවා. එතකොටම වෙඩි උණ්ඩ ගණනාවක් එක සැරේ පත්තු වුණා.

''බොහොම අගෙයි. බොහොම අගෙයි. ඒත් තව සැරයක් වෙඩි තියන්න. උන්ට එක පාරක් වෙඩි තියල මදි'' ගෙක් කිව්වා.

දෙපැත්තෙන් නිදා උන්නු ආදරවන්ත පුත්තු දෙන්නම දහලනඕ දුනිලා අම්මට ඇහැරුණා. එයා වුක් දිහාට හැරෙන විට මොකක්ද තද දෙයක් එයාගේ ඇඟේ ඇනුණා. වුක් හොරෙන් කොට්ටේ යට තියාගත්ත කම්බි කැල්ල එතකොට අම්මාට අහුවුණා.

අම්මා කම්බි කැල්ල අහකට විසිකර දලා හඳ එළිය වැටිල තිබුණු ගෙක්ගේ මුණ දිහා බැලුවා. ඒ මුණින් පෙනුනේ එයාට නරක හිතයක් පෙනෙන බව. හිතයක් කම්බි කැල්ලක් වගේ අහකට මිහිරි කරලා දමන්ට බෑ. ඒත් ඒවා 'නිවා දමන්ට' පුළුවන්. අම්මා උණු බැල්ලෙන් නිදා හිටිය ගෙක් ඇලයට හරවලා එයාගේ උණුසුම් නලලේ පිම්බා.

එතකොටම ගෙක් හුස්මක් හෙලලා නින්දෙන් හිනා වුණා. ඒ කෙනා පෙනුනේ නරක හිතය මැකී ගිය වගයි.

ඊට පස්සේ අම්මා හිම යපත්තු නොදම ජනේලය ලඟට ගියා.

තවමත් එළිවී නැහැ. අහස පුරාම තාරකා. සමහර තාරකා බොහොම ඉහලින් පායලා තිබුණා. තවත් සමහර ඒවා තියිගා වනාන්තරයේ ගස් ලඟින්ම පායා තිබුණා.

ඉතින් පුදුමයට කාරණයක්:—පුංචි ගෙක් හිටිය තැනම ඉඳගෙන ගෙක් හිතපු විදිහටම අම්මත් හිතුවා—ඇඟේ සාධාරණයා ඉන්නේ කොච්චර ඇතද? ලෝකේ එයිට වඩා ඇත තැන් තියෙන්නේ ටිකයි කියලා එයත් කල්පනා කළා.

පසුවද මුළු දවසෙම ඒගොල්ලෝ ගිය පාර දෙපැත්තේ තිබුණේ කැලෑවයි නදුයි. කඳු නගින කොට කරත්තකාරයා හිම කරත්තයෙන් බැහැලා පයින් ගියා. ඒවුනත් ලොකු පල්ලම්වල හිම කරත්තය කොතරම් වේගයෙන් ගියාද කියනවා නම් ළමයි දෙන්නට දැනුනේ කරත්තය අහසේ ඉඳලා බිම්බ කඩා වැටෙනවා වගේ.

අන්තිමේදී හොඳටම හවස්වීගෙන එනකොට අස්සයින්ටයි මනුස්සයින්ටයි හොඳටම මහන්සි දැනුනට පස්සේ, කරත්තකාරයා එපන්න මේගෙම කිව්වා.

"ඔන්න ඉනින් අපි ආවා. මෙතනින් ටිකක් එහා වංගුවක් තියෙනවා. එතන තියෙන පිට්ටනියේ තමා ඒගොල්ලන්ගේ නටෑතැන් පොල තියෙන්නේ.

වුක් සහ ගෙක් කරත්තයෙන් බැස්සේ හුහක් සන්තෝසයෙන්. අම්මා බුල් තොප්පියක් දමාගෙන, ඔලුවේ බැඳලා තිබුණු ලේන්සුව අතට අරගෙන සිනා මුණින් බලාගෙන හිටිය.

එතන ඒ කියපු වංගුව තිබුණා. ගිම කරත්තය ආපහු හැරිලා පුංචි ගෙවල් තුනක් ගාවින් තව ටික දුරක් ගියා.

බොහොම පුදුමයි! බල්ලෝ බුරන හඬකුත් ඇහෙන්වි නෑ; මනෙන්ට මෙනගත් නෑ; ගෙවල්වල දුම්නල වලින් නහින දුම් මතෙන්ටත් නෑ. හැම පාරක්ම හිම වලින් වැහිලා. අවට කිසිම. සද්දයක් ඇහෙන්ටත් නෑ. දෙපැත්තේ සුදුපාට ලස තියෙන කුරුල්ලෝ වහයක් ගහින් ගහට පනිමින් හිටියා,

"අපව මේ කොහාටද ගෙනත් දැමමේ? මේ ආපූ තැන හරිද?" කියා බයවී සිටි අම්මා කරත්තකාරයාගෙන් ඇහුවා.

"මා එක්ක ආවෙ කියාපු කැනට. මෙ තියෙන ගෙවල්වලට කියන්නේ 'හුගර්හ විදියා පර්යේෂණ කඳවුර අංක තුන' මෙතියෙන්නේ දැන්ටම ලෑල්ල නැත්නම් කඳවුරු අංක හතරද දන්නේ නෑ. එතනට තව හැතැප්ම එකයිය විසි පහක් තියෙනවා" යි කරත්ත කාරයා කිව්වා.

"නෑ නෑ තැන නම් මෙක වෙන්ට ඕනෑ. ඒත් බලන්න දෙරවල් වලට යකුරුදුලා. පඩි පේලි හිමෙන් වැහිලා. මෙහේ හිටිය මිනිස්සු කොහාට ගියාද?" අම්මා කිව්වා.

"මට හිතාගන්ට අමාරුයි ඒගොල්ලො කොහාට ගියාද කියලා, ගිය සුමානේ අපි බඩු අරන් මෙහාට ආවා...පිටි, ලුණු, අර්තාපල්හෙම. එතකොට ඔක්කෝම මිනිස්සු මෙහෙ හිටියා. අට දෙනෙක් නායකයයි නමයයි. මුරකාරයත් එක්ක දහ දෙනයි. මේ මිනියුන් ඔක්කොම වෑකයෝ මරල කාලවත්ද? ඔයගොල්ලෝ ඔහොම ඉන්න. මම මුර කාරයා ඉන්නවද කියලා බලලා එන්නම්."

ඉතින් කරත්ත කාරයා හීම ගොඩවල් අතරින් කෙළවරේම තිබුණු ගේ පැත්තට ගියා: ඉක්මනින් ආපහු ආවා.

''ගෙයි කවුරුවත් නෑ. ඒත් ලිපේ ගින්දර ඇවිලෙනවා. ඒ කියන්නේ මුරකාරයා වැඩි ඈතක ගිහින් නෑ. මා ඕතනවා දඩයමේ යන්ට ඇති රුවෙන්න කලියෙන් එයි ඇවිත් ඔක්කොම තොරතුරු කියන්නේ නැතැ''

',එයා කියන තොරතුරු වලින් අපට වැඩක් වෙයිද? මෙතන හුඟ කලකින් මිනිස්සු ඉඳලා නැති බව මටම පේනවා''

''ඈයා මොන වීදිහේ ඈකාරතුමක් කියයිද කියලා මට කියන්න බෑ වෙලා තියෙන දේ මොකක්ද කියලා කියන්නේ නැතැ. ඒක මුර කාරයකුට අයිති එක වැඩක්නේ' යි කරත්ත කාරයා කිවා

කැලේ අතරින් වැටුණු පාරක් දිගේ ඒගොල්ලො මුරකාරයාගේ ගෙට ගියා. ඉස්කෝප්ප, පොරෝ. ලීකොට, යකඩ කොක්කක එල්ලා තිබුණු වලස් හමක්, මේ වගේ තවත් නොයෙක් දේවලුත් ගොඩගහලා තිබුණු තැනකින් ඒගොල්ලෝ ගෙට ඇතුලු වුණා

කරත්තකාරයා ඔවුන්ගේ බඩු බාහිරාදිය ගෙට ගෙනත් දැම්මා. ගේ ඇතුලේ සීතලක් නෑ කරත්තකාරයා අස්සයින්ට කෑම දෙන්ට ගියා අම්මා කිසි කතාබහක් නැතුව බයවී සිටි ළමයින්ගේ පිට ඇඳුම් (ශීත ඇඳුම්) ගැලෙව්වා.

''තාත්තා බලන්ට ආවා ආවා' බොහොම දුර ඉඳලා ආවා. ඔන්න දැන් වෙච්ච දේ!''

අම්මා එතන තිබුණු බංකුවක් උඩ ඉඳගෙන කල්පනා කරන්ට පටන් ගත්තා. මේ සිදුවෙලා තියෙන්නේ මොකක්ද? මෙතන කවුරු වත්ම නැත්තේ ඇයි? දැන් ඉතින් මොකද කරන්නේ? ආපහු යනවාද? ඒත් කරත්තකාරයාගේ ගමන් ගාස්තුව ගෙවපුවහම අම්මගේ සල්ලි ඉවරයි. දැන් ඉතින් කරන්ට තියෙන්නේ මුරකාරයා එනතුරු ඉන්න එක විතරයි. ඒත් තව පැය තුනකින් විතර කරත්ත කාරයා ආපහු යනවා. මුරකාරයත් ඉක්මනින් එන එකක් නෑ. එතකොට මොකද කරන්නේ. ලඟම තියන දුම්රිය පොලටත් විදුලි පණිවුඩ කාර්යාලය වත් දුර හැතැප්ම සියයකට අඩු නැහැ.

කරත්තකාරයා ආයෙත් ගෙට ගොඩ වුණා: ලිප පැත්තෙන් එන සුවඳ මොකක්ද කියලා බැලුවා; ලිප ලහට ගිහින් ලිපේ තිබුනු වලඳ ඇරලා බැලුවා:—

''මුරකාරයා රෑ වෙන්ට ඉස්සර එයි. මේ ලිප උඩ තියෙන්නේ සුප් එකක්. හුහ වෙලාවකට ආපහු නොඑන්ට ගියා නම් සුප් එක ලිප උඩ තියලා යයියැ''යි කියමින් කරක්ක කාරයා අම්මා සතසන්ට හැදුවා. ආයේ මෙහෙමත් කීවා:

''ඔයගොල්ලෝ කැමති විදිහක් කරන්න. වෙච්ච දේට දැන් ඉතින් මොකද කරන්නේ? මම නරුඅ මිනිහෙක් නොවේ. ඔයගොල්ල කැමති නම් මම දුම්රිය පොලට ගිහින් ඇරලන්නම් මුදල් නැතුව''

''නෑ එපා. දුම්රිය පොලට ගිහින් අපි මොනවා කරන්ටද''යි අම්මා කීවා.

ආයෙත් කේතලය ලිපේ තිබ්බා; කල්බසා රත්කරලා කෑවා; තේ බීවා. අම්මා බඩු අස්පස් කරද්දී චුක් සහ ගෙක් උණුසුම් උදුන උඩට ගොඩවුණා. හිත කැලඹිලා හිටිය නිසා අම්මා තවම කිසිම කතා බහක් නැතිව සිටියේ ඒ නිසා. චුක් සහ ගෙක්ද කතා කළේ නැහැ. ඉතින් කාටවත් වැඩිවෙලා නිශ්ශබ්දව ඉන්ට බැරි නිසා දෙන්නටම තදින් නින්ද ගියා.

කරත්තකාරයා ආපහු යන්ට සූදානම් වෙන හැටියේ අම්මා උදුන උඩට නැග ළමයි දෙන්නා ලඟින් නිදගත් හැටියේ ඒගොල්ලන්ට දැනුනේ නැහැ. ඔවුන් අවදි වෙන විට ගෙට හොඳටම කලුවර වැටිලා. තුන්දෙනාම ඇහරුණේ එක සැරේ, පඩි පෙල දිහායින් අඩි සද්දයක් ඇහුණු නිසා. ඉස්කෝප්පයක් පෙරලෙන හඬක් ඇහුණා. එක පාරටූ දෙර ඇරුණා; ලන්තෑරුමක් අතේ අරගෙන මුරකාරයා ගෙට ආවා, එයා පස්සෙන් ලොම් දිග ලොකු බල්ලෙක් ආවා. මුරකාරයා උරහිසේ එල්ලාගෙන තිබුණු තුවක්කුව අහකින් තියලා, මරපු හාවෙක් බංකුව උඩට විසි කළා. ඊට පස්සේ උදුන දිහාට අතේ තියෙන ලන්තෑරුම අල්ලා බැලුවා.

''අපේ ගෙදරට අමුත්තෝ කට්ටියක් ඇවිත් වගේ''

''මම භූගර්භ විද්‍යා කඳවුරේ වැඩ කරණ සිරේගින්ගේ බිරිඳ. මේ අපේ ළමයි. ඕනෑ නම් මෙන්න හැදුනුම්පත්',යි අම්මා උදුනින් බහිමින් කීවා.

"ඔය කියෙන්නේ හැඳුනුම් පත්. ඔය උදුන උඩ ඉන්නේ හැඳුනුම් පත් තමා" යි මුරකාරයා චුක් සහ ගෙක්ගේ මුණුවලට ලන්තෑරුම් අල්ලමින් මහ හඬින් කියන්ට පටන් ගත්තා. "ඔව් මේගොල්ල කාත්තාව පෙන්නුම් කරන්ට අඹුපු රූප වගේ. වැඩියෙන්ම මේන්න මේ මහත ඉලන්දරියා" කියමින් ඔහු චුක්ටු ඇගිල්ලෙන් ඇන්නා.

ළමයි දෙන්නම අමනාප වුනා. චුක්ට තරහ ගියේ එයාට මහත ඉලන්දරියා කියාපු නිසා. ගෙක් හැමදාම හිතුවේ එයා අයියාට වැඩිය කාත්තා වගේ කියා. ඒ නිසා එයත් අමනාප වුනා.

"දැන් කියන්න ඔයගොල්ලෝ ආවේ ඇයි කියලා. ඔයගොල්ලෝ ආපු එක නරක වැඩක්?" මුරකාරයා අම්මාගෙන් ඇහුවා.

"ඇයි කොහොමද? නරක වැඩක් වෙන්නේ" අම්මා ඇහුවා.

"නරක වැඩේ කියන්නේ මෙන්න මේ නිසයි:—සිරේ-ගින්ගේ විදුලි පණිවුඩේ කන්තෝරුවට ගෙනිච්චේ මමයි. ඒකේ පැහැදිලිව කියලා තිබුණා "සකි දෙකක් යන තුරු එන්ට එපා." අපි තයිගා වනාන්තරේට යනවා. සිරේගින් කිව්වනම් දන්ම එන්ට එපා ගමන කල්දන්ට කියලා තිබුණේ එහෙම කරන්ටයි. ඉතින් ඔයගොල්ල මේ හිතුමතේට කරපු වැඩක්:

"මොන විදුලි පණිවුඩයක්ද?" අම්මා මෙතනදී හරස් ප්‍රශ්නයක් ඇහුවා. "ඔය කියන විදුලි පණිවුඩේ අපට ලැබුණේ නෑ." ඉතින් අම්මා එහෙම කියලා චුක් සහ ගෙක්ගෙන් ඒ අදහසට අනුමැතියක් ලැබෙයි කියලා ඒ ගොල්ලෝ දිහා බැලුවා. අම්මාගේ බැල්මෙන් බයවුණු චුක් සහ ගෙක් එක එක්කෙනා දිහා බලලා උදුනේ තවත් එහාට වෙලා හැංගුණා.

අම්මා සැකයෙන් ළමයි දිහා බලමින් මෙහෙම ඇහුවා.

"ළමයිනේ මා නැති වෙලාවේ විදුලි පණිවුඩයක් හෙම් ලැබුණේ නැද්ද?"

උදුන උඩ තිබුණු දර, වීඇලි කොළ ආදී දෙවල් හෙලවෙන හඬ ඇසුණා මිස උත්කරයක් ලැබුණේ නැහැ.

"උත්තර දිපල්ලා වදකාරයෝ දෙන්නා. මා නැති වෙලාවේ විදුලි පණිවුඩයක් එන්ට ඇති. ඔයගොල්ල ඒක මට දීල නෑ."

තව්ත් තත්පර කීපයක් ගතවුනා. ඊට පස්සේ උදුන දිහායින් එකාකාර විදිහක ඇඩිල්ලක් ඇහෙන්ට වුනා. ඒ ඇඩිල්ලේ තිබුණේ ලොකු මිත්‍ර ලීලාවක් නැත්නම් සහෝදර කමක්. වුක් ගැබුරු අඩකින් එකාකාර වීදියකට ඇඬුවා. ගෙක් හීන් අඩකින් ඉකි හසමින් ඇඬුවා.

"ඔන්න මගේ විනාසෙ වෙච්ච තැන. ඔන්න මාව අමු අමුවේ මිනීවලට ගෙනියන මිනිස්සු. ඔකන මොරදෙන එක නවත්තලා වෙච්ච දේ ඔක්කොම කියනවා."

අම්මා අකාලේ මිනීවලට යන බව අහලා දුක හිතිලා වුක් සහ ගෙක් තවත් හයියෙන් අඬන්ට වුනා. ඉතින් ඊළඟ පස්සේ ලජ්ජා නැති වීදියට වැරදී එක එක්කනාගේ කරපිට පටවමින්, එකිනෙකාගේ කකුලට බාදු කරමින් වෙච්ච කණගාටු දුකක සිද්දිය කියන්ට වුක්ටයි හුහක් වෙලා ගතවුණා.

ඉතින් මේ වගේ මිනිස්සුන්ට දෙන්ට තියෙන දඬුවම මොකක්ද? කෝටුවකින් තලන එකද? හිරේ දාන එකද? මාංචු දාන එකද? බරපතල වැඩ ඇතුව හිර කරන එකද? නැහැ, අම්මා මේ කිසීම දඬුවමක් දන්නේ නෑ. සුසුමක්හෙලලා ළමයින්ට කීවා උදුනෙන් බැහැලා මුණ සෝදන්ට කියලා. ඊට පස්සේ, දැන් ඉතින් කරන්නේ මොකක්ද කියා මුර කාරයාගෙන් අහලා බැලුවා.

"අපි මේ දවස් දහය ගතකරන්නේ කොහොමද? අපි කැමට දේවල් ගෙනත් නෑ" අම්මා කීවා.

"ඔහේ පුළුවන් විදිහකට ඉන්න. මම පාන් දෙන්නම්. ඔන්න හාවෙකුත් තැගි කරනවා, හමගහලා උයාගන්න. මම හෙට තයිගා වහාන්තරේට යනවා. මං අටෝපු උගුල්වලට සත්තු අහුවෙලාද කියලා බලන්ට තියෙනවා" යි මුරකාරයා කීවා.

"එහෙම කරන්ට අමාරුයි. අපි මෙහේ තනියම ඉන්නේ කොහොමද? අපි මේ පළාත් ගැන මොකුත් දන්නේ නෑ. මෙහේ රුස්ස කැලේ ඒකේ වන සිවුපාවෝ ඉන්නවා" යි අම්මා කීවා'

,'මම ඔහේ තුවක්කු වලින් එකක් තියලා යන්නම්, දර, අර අර මඩුවේ තියෙනවා. අර කදු ගැටේ ගාව දිය උල්පත. සුප්වලට ගන්න ධාන්‍ය වර්ග අර ගෝනියේ තියෙනවා. අර බෝතලේ ලුණු. මම කෙලින්ම කියන්ට කැමතියි, මට ඔයගොල්ලන්ට සාක්කු සප්පා යම් කර කර ඉන්ට වෙලාවක් නැති බව"

''මේයානම් මහ නපුරු මාමා කෙනෙක්'' පුක් අඩි එයාට වඩන යක් දෙකක් කියමුද?''යි ගෙක් පුක්ගේ කණට කර කීවා.

''ඔන්න ඉතින් තවත් මෝඩකමක්! එහෙම කළොත් එයා අපී ඔක්කෝම ගෙයිනුත් පන්නා ගනියි. අපි ටිකක් ඔහොම ඉවසමුකෝ. කාත්තා ආවාම් ඔක්කොම කියමු''යි පුක් ඒ අදහසට එකඟ නැති බිව කීවා.

''කාත්තා ආපුහාම? කාත්තා එන්ට තව කොච්චර කල් තියෙනවද?''

මුරකාරයා එයා ඇඳගෙන හිටිය ලොම් කබාය ගලවලා මේසය පිහනය පැත්තට ගිහින් ඒක ජනේලයෙන් ආ මඳ එළියට අල්ලා බැලුවා. ඉතින් ගෙක් ඒ දිහා බලන කොටම් එයාව පෙනුනා ඒකේ පිටේ ඉඳලා දනගිස දිහාට විතර ලොකු කොඩයක් ඉරි කිබෙන බව.

''ලිපෙන් සුප් වලඳ බාන්න. ඔන්න රාක්කේ හැඳියි පිඟනුයි. බෙදගෙන බොන්න''යි අම්මා කීවා.

',ඔබනේ ගෙදර අයිතිකාරයා. ඒ හින්ද බෙදන්න. අපවත් බෙදන්න. මෙහාට ඔය ලොම් කබාය දෙන්න. ඔම ඒක මහලා දෙන්නම්''යි අම්මා ආයෙ කීවා.

මුරකාරයා හැටි බලන කොට ගෙක්ගේ කරහගිය මුණ දක්නා.

''හෝ හෝ මට පෙනෙනව දැන්, ඔයාගේ මූණෙන්ම ඔයා හික තද ළමයෙක් වග'' මුරකාරයා එහෙම කියලා ලොම් කබාය අම්මා අතට දීලා පිහන් ගන්ට රාක්කය ලඟට ගියා.

''ඔක කොහොමද ඉරුනේ''යි පුක් කබායේ ඉරුන තැන් පෙන්-වමින් ඇහුවා.

''වලස්සු එක්ක යාළුකම් නැනේ. ඌ නියපොතු වලින් මාව පහුරු ගැවා.''මුරකාරයා මෙහෙම නොකැමැත්තෙන් උත්තර දීලා බර සුප් වලඳ මේසය උඩින් තිබ්බා,

''ඇහෙනවද ගෙක්'' එයා අද වලහෙක් එක්ක පොරකාලා තියෙනවා. බාගවිට අද ඔය තරහින් වගේ ඉන්නේ ඒනිසා වෙන්ට ඇති', කියා පුක් මුරකාරයා දෙරකඩට ගිය අතර කීවා.

මූරකාරයා කියාපු දේවල් ඔක්කොම ගෙක්ටද ඇහුණා. කිසිම කෙනෙක් අම්මා අමනාප වෙන විදිහේ දේවල් කියනවට එයා කැමති නෑ. වලහෙක් එක්ක පොර කන්ට පුළුවන් හපනෙක් වුනත් අම්මට එහෙම කතා කරනවට එයා කැමති නැහැ.

උදේ පාන්දර, ඉර පායන කොටම මූර කාරයා ගෝනියකුයි තුවක්කුවයි අරගෙන බල්ලන් එක්ක කැළයට ගියා. එයා ගියේ ගිම ලී ඝතුරු වලින්.[1]

දැන් ඉතින් තම තමන්ගේ වැඩ තම තමන්ටම කරගන්ටයි වෙලා තිබෙන්නේ. තුන් දෙනාම එකතුවෙලා වතුර ගෙනෙන්ට ගියා කඳු බැවුමට. එනායින්, ගහක් වගේ කෙළින් ඉහිටලා තිබුණු ගලේ ගිම ගොඩවල් අතරේ දිය උල්පත තිබුණා. හරියට කේතලයකින් නගිනව වගේ ඒ වතුරෙන් වාෂ්ප පිටවුණා. ඒත් වුක් වතුරට ඇඟිල්ල දමලා බැලුවාම එයාට දැනුනා ඒ වතුර අයිස්වලටත් වඩා ඝිතල බව.

ඊට පස්සේ ගිහින් දර ගෙනාවා. පැරණි වර්ගයේ රුසියන් උදුන් වලේ ගින්දර දමන හැටි අම්මා දැනගෙන හිටියේ නැති නිසා දර ඇවිලෙන්ට හුහක් වෙලා ගියා. ඒත් ඇවිලුනාට පස්සේ ගිණි දළු වලින් කෙව්වර උණුසුම්ක් ආවද කියනව නම්, ලිපට ඉස්සරහින් බිව්වියේ තිබුණු ජනේලේ වීදුරුවේ බැඳලා තිබුණු හිම ඉක්මනින්ම දිය වෙලා ගියා.

ඒ නිසා දැන් ජනෙල් වීදුරුව අතරින් වන තිරයේ තිබුණු ගස් පෙනෙන්නට වුනා. ඒ ගස් අතර කවුඩු රුනක් ඒ වේ අත පනිමින් හිඹියා, ගල් කුළු ගණනාවක් තියෙන නිල් කඳු වැටියත් ගස්වලට උඩින් පෙනෙන්ට වුනා.

කුකුල්ලු හමගහලා උයන්ට අම්මාට හොඳට පළපුරුදුයි. ඒත් හාවෝ හම ගැසීමයි මස් කරන එකයි එයා කවදාවත් කරලා නැති වැඩක්. ඒනිසා ඒ වැඩේට ගොනෙක් හෝ එළදෙනක් හමගහලා මස් කරන වෙලාව විතර වෙලාවක් ගියා.

---

[1] හිම උඩ ලිස්සා යාමට පාවිච්චි කරණ ලී. මේවා සැකසන්නේ සපක්තුවලට

ගෙක්ට මෙක කිසිම ආශාවක් ඇතිවන විදිහේ වැඩක් නූනත් මුක් තම බොහොම ආසාවෙන් අම්මාට උදව් කළා. ඒකට තැග්ගක් වශ යෙන් එයාට හෑවල්ගය ලැබුණා. ලොම් සහිත හාවල්ගය කොච්චර සැහැල්ලුද කීවොත් ඒක උඩ දැමුවාම පැරපුට් කුඩයක් වගේ පාවෙමි බිමට වැටෙන්නේ.

කැමෙන් පස්සේ කුත්දෙනාම ඇවිදින්ට ගියා

මුක් අම්මාට ඇවිටිලි කළේ කුටක්කුවත් අරගෙන යමු කියලා බැරිනම් පතරොම් එකක් දෙකක් වත් අරගෙන යමු කිව්වා, ඒත් අම්මා කුටක්කුව අරගත්තේ නෑ.

ඒවෙනුවට කළේ කුටක්කුව බිත්තියේ ඉහළ තිබුණු කොක්කක එල්ලා, බංකු පුටුව උඩට නැගලා පතරොම් ටික රාක්කයේ ඉහළම තට්ටුවෙන් තැබීමයි. එතනින් එක පතරොමක් වත් ගන්ට හැදුවොත් එයාගේ ජීවිතේ නරක අතට හැරෙයි (වැඩේ වරදියි) කියල මුක්ටකීවා.

මුක්ගේ මුහුණ ලජ්ජාවෙන් රතුවුණා. එයා ඉක්මනින් එතනින් අහකට ගියා, ඒ මොකද කියනව නම්, එක පතරොමක් දැනටමත් මුක්ගේ සාක්කුවේ තිබුණා,

එගොල්ලො ගිය ගමන හරිම පුදුමාකාර එකක්! කුත් දෙනා පටු පාරක් දිගේ පේලියට ගමන් කළා. ඉහළ ගිනිල නිල් අහස බැබලි බැබලි තිබුණා. සුරංගනා කතාවල කියන මායා මාලිගා, කුලුණු සහ කොත්වගේ උල්වූ මුදුන් ඇති නිල් කදු වැටිය අහස උසට ඉහළට විහිදිලා තිබුණා. ශීතල නිසලතාවය අතරින් කවුඩු රැහ මොනවාට දෝ පුදුමයට පත්වුනා වගේ හයියෙන් කෑගැහුවා. කේදර ගස්වල ශාඛාට වැඩුණු අතු අතර, අලුපාට මුරුබුහුටි ලේන්නු කඩිසර විදියකට පැන පැන උන්නා. ගස්යට වැතිරී තිබුණු සුදු මොලොක් හිම උණු නොදන්නා සිවුපාවුන්ගේ හා කුරුල්ලන්ගේ පාසටහන් තිබුණා.

දැන් කයිගා වනාන්තරය අතරින් වැලපිමක් වගේ තියුණු හඬක් ඇහුණා, ඊලහට ඇත අහස ගොරවනව වගේ ගැඹුරු එකාකාර හඬක්! ඒ එක්කම මහ හඬින් මොකක්ද කඩා වැටෙනවා ඇහුණා. සමහරවිට ගස්වල අතුපතර කඩාගෙන කොගේදෝ ඉහළ සිට ඊදුණු දිය බිංදුව පත්වුනු මහා විශාල හිම කැටියක් බිම වැටුණා වෙන්ට ඇති.

ගෙක් මොස්කව් නගරේ ඉන්නකොට හිතුවේ මුළු ලෝකෙම මොස්කව් නුවර කියලා—ඒ කියන්නේ මුළු ලෝකෙම විදි, ගෙවල්, වීදුලි රිය හා බස් විතරයි තියෙන්නෙ කියලා.

දැන් එයාට හිතුනේ මුළු ලෝකෙම තියෙන්නේ, රුස්ස ගස් තියෙන මහ කැලේ කියලා.

ගෙක් ඉන්න තැනට හොඳට අව්ව පායලා තිබුණා, නම් ගෙක් හිතන්නේ මුළු ලෝකෙම අහසේ කොංගේපත් වලාකුල් නෑ කියා.

තමන් සතුටින් ඉන්න කොට එයාට හිතෙන්නේ මුළු ලෝකෙම මිනිස්සු ප්‍රීතියෙන් ඉන්නවා කියායි.

දවස් දෙකක් ගතවුණා; තුන් වැනි දිනද උදාවුණා. පනාන්තරයටම ශීය මුර කාරයා තවම ආපහු ආවේ නෑ. ඉතින් හිමෙන් වැහුණු හිම තැම්බරුණු ඒගොල්ලන්ගේ පුංචි ගෙයි බිය රජ කරන්නට පුළුණා.

වඩාත්ම බය දැනුණේ සවස් යාමයවත් රැටත්. ඒගොල්ලෝ හැකි තරම් සුරුකිව දොරවල් වැහුවා, අඟුලු දැම්මා. සත්තු එළිය දැකලා ගේ පැත්තට එයි කියලා එළිය පිටට නොපෙනෙන්නට ජනෙල් තිර දැම්මා. ඒත් කරන්ට තිබුණේ සම්පූර්ණයෙන්ම අනිත් පැත්ත...වන සිව්පාව මනුස්සයෙක් වගේ නොවෙයි. උා ගින්නට බයයි.

හුලං හමන වෙලාවට වහලයේ තිබුණු දුම් නලය ගැඹුරු හඬ ඇති නලාවක් වගේ ශබ්ද කළා. හිම කුණාටු හමන වෙලාවට හිමත් එක්ක වැටුණු තියුණු අයිස් කැබලි ජනේලයේත් බිත්ති වලත් වැදුණු හඬ කාටත් ඇහුණේ සතෙක් දෙර පහුරුගානවාත් දෙර තල්ලු කරනවාත් වගේ. තුන් දෙනාම උදුන උඩට වී නිදාගත්තා. අම්මා හුහාක් වෙලා යනතුරු නොයෙක් තොරතුරුත් කතාන්තරත් කිවා. අන්තිමේදී එයාට නින්ද ගියා.

"පුක්, මොකද මන්තර කාරයෝ කියලා මිනිස්සු ජාතියක් (වර්ගයක්) ගැන කතන්දරවල විතරක් කියවෙන්නේ. ඒගොල්ල ඇත්තටම හිටිය නම් හොඳයි නේද?" යි ගෙක් ඇහුවා.

"මන්තර කාරයෝ විතරක් නෙවෙ. යක්ෂයොයි මායාකාරියොයි හිටියා නම් ඒත් හොඳද?"

"නෑ. යක්ෂයෝ හිටියා නම් හොඳ නෑ. උන්ගෙන් ඇති පලේ මොකක්ද? මන්තර කාරයෝ හිටියා නම් අපිට කියන්ට තිබුණා ඉහලින් ගිහින් කාන්තාට කියන්ට කියලා අපි මෙහාට ඇවිත් හුහක් කල් කියලා."

"ඉතින් එයා ඉහලින් යන්නේ කොහොමද? මොකක හැඟිලද?"

ඒගොල්ලන්ට අත් වනවනා ඉගිලෙන්ට පුළුවන් ඇති. නැත්නම් වෙන ක්‍රමයකට ඒක අපි කියන්ට ඕනෑ නෑ. ඒගොල්ලෝ හොඳට දන්නවා කොහොමද ඒක කරන්නේ කියලා"යයි ගෙක් කිවා.

"මේ වෙලාවේ අත් වන වනා ඉගිල්ලෙන්ට හිතල වැඩියි.

මේ බලන්න මගේ අත්වල තියෙන්නේ කොටමිර යෂකම වෙස්ද? ඒත් අද දර ගෙනෙන්ට ගිය වෙලාවේ මගේ අත් සම්පූර්ණයෙන්ම හිරි වැටිණා."

"ඒ වුණාත් මන්තර කාරයෝ හිටියා කම් හොඳයි නේද? දීක්ක කියන්න හොඳයි නේද?"

හොඳද නරකද කියලා තීරණයක් ගන්ට බැරුව වුක් වෙහෙම කිවා:—

"ඔයාට මතකද මිෂ්කා ක්‍රැකප් හිටිය තැන, බිංගෙයි. කවුද්ද නොට්ඩියෙක් හිටියා, මිනිහා පාං වලලු වික්කා, එයා හම්බවෙන්ට නොයෙක් විදිහේ ගැනු ආවා. නාකි ආවට්ලත් ආවා. ඒගොල්ලන්ට මිනිහා සාත්තර කිවවා, කාටද හොඳ කාලයක් ලබන්නේ, කාටද අපල කාලයක් ලබන්නේ කියලා."

"ඉතින් එයා කියාපු සාස්තර හරිගියාද?"

"මං දන්නේ නෑ ඒක. පස්සේ පොලිසියෙන් එයාව අල්ලගෙන ගියා. එයාගේ ගෙයි නොයෙක් විදිහේ අනුන්ට අයිති ඉද්වල් කිහිලා හම්බවෙලා කියෙනවා. එච්චරයි මං දන්නේ."

"එහෙනම් එයා මන්තර කාරයෙක් නෙවේ, බාගදාට හොරෙක් වෙන්ඩ ඇති. ඔයා හිතන්නේ කොහොමද වුක්?"

වුක් ද මේ අදහසට එකඟ වෙලා මෙහෙම කිවා:—

හොරෙක් නේත්තම්. මමත් හිතන්නේ එහෙමයි. සේරම මන්තර කාරයෝ කියන උදවිය හොරුයි බොරු කාරයොයි වෙන්ට ඕනෑ ඕනෑම පුංචි සිදුරකින් රිංගන්ට පුලුවන් නම්, වෙන හාස්කම් කන්ට පුළුවන් නම් උන්ට රස්සාවල් මොකටද? කවුරු වුනත් අනුන්ගේ දේවල් ගන්න එක වැරදියි. ගෙක් දැන් ඔයා නිදා ගන්න. ඔයා නිදාගත්තත් නැතත් මං ඔයිට වැඩියෙ ඔයා එක්ක කතා කරන්නෙ නෑ.

:"ඒ මොකද?"

"ඔයා කවට එන වල්පල් දෙවිවනවා. එවා ඔයාට රෑට හිනෙන් පෙනෙනවා. එකෙකොට පයින් අනින්ඩයි දඟලන්ඩයි පටන් ගන්නවා ඊයේ රෑ නින්දෙන් ඔයා මිටමොල්ලවල මගේ බඩට ඇන්නා. ඒක හොඳ වැඩක්ද? මාත් බලන්ඩ ඔයාගේ බඩට අනින්ඩද?"

හතරවෙනි දවසේ උදේ අම්මාට දර පලන්ට සිද්ද වුණා. හාමස් ඉවර වෙලා දැන් හුහක් කල්. කවුඩෝ ඇවිත් උගේ ඇටකටු කෑලේට අරන් ගියා. පදු දවල් කෑමට එගොල්ලෝ හදා ගත්තේ ලුණුත් තෙලුත් මිශ්‍ර කරපු වැඩි රසක් නැති තලපයක්. පාතුත් දැන් ඉවර වෙලා. අම්මා පිටි ටිකක් අරගෙන රොටි හැදුවා.

මේවගේ වැඩි සරුවක් නැති දවල් කෑමකට පස්සේ ගෙක් කටබාගෙන කණගාටෙන් වාගේ හිටියා අම්මට හිතුනා උයාට උණ ගැහෙන්ට එනවා වත්ද කියලා.

උයාට ගෙදර ඉන්ට කිසලා, වුක්ව හිම ඇතුම අන්දවාගෙන බාල් දීළා. රෝද නැති අත් කරත්තෙයි අරගෙන වතුර ගෙනෙන්ටත් කෑලෙන් දර ඇහිඳ ගෙන එන්ටත් කියලා අම්මා පිටත් වුණා.

දැන්ම දර ගෙනාවොත් උදේට උදුනට ගින්දර දැමීම පහසුයි,

ගෙක්ට තනියම ගෙදර ඉන්ට සිද්ද වුණා' එයා අම්මයි අයියයි ණතුරු හුහක් වෙලා බලා හිටියා. උයාට පාළුවක් දැනුනා. එනියා කණ්ට දෙයක් නැහැ හිත හිතා හිටියා,

අම්මයි පුතයි හුහාක් ප්‍රමාද වුණා. වතුර අරගෙන ගහන් එනකොට කුඩා කරත්තය පෙරලි වතුර බාල්දි හැලි ගියා. ආයෙත් දිය

උල්පත ගාවට යන්ට සිද්ද වුණා. ඊට පස්සේ වුක්ට උල්පත ලඟ එයාගේ සහකම අත්මෙස් එක බැරිවුණු බව මතක් වෙලා ආයෙත් සැරයක් දිය උල්පත ගාවට යන්ට සිද්ද වුණා.

ගෙදර එන විට ගෙක් හිටියේ නෑ. මුලදී ඒගොල්ලෝ හිතුවේ එයා උදුන උඩ තිබුණු බැටළු හම්වලට එහායින් සැඟවිලා ඉන්නවා කියා. ඒත් එතනත් එයා නෑ. ඒතකොට වුක් දහකාර විදිහකට හිනාවෙලා අම්මා දිහා බලලා එයාගේ ඇහටත් ඇනලා කිව්වා ගෙක් සැක නැතුව උදුන යට හැංගිලා ඇති කියලා.

අම්මා තරහ ගිහින් එයාට සැරකරලා උදුන යටින් එළියට එන්ට කීවා. ගෙක් අම්මාගේ වචනයට කීකරු උනේ නැහැ. ඔක් දිග ලීයක් හොයාගෙන ඒකෙන් උදුන යටට ඇන්නා. උදුන යටක් ගෙක් හිටියේ නෑ.

අම්මා හරියට බයවුණා. දෙර ලඟ බිත්තියේ ගසා තිබුණු ඇණය දිහා බැලුවා. ඒකක් එල්ලා තිබුණු ගෙක්ගේ හිම කබායවත් හිම තොප්පියවත් එතන තිබුණේ නෑ

අම්මා මිදුලට බැහැලා ගේ වමේවම ඇවිද්දා දෙර ලඟට ඇවිත් ලන්තෑරුම පත්තු කරගෙන අඳුරු ගබඩා කාමරයේත් දර මඩුවේත් බැලුවා.

අම්මා ගෙක්ට අඬගැවා. එයාට බැන වැදුනා. එත් උත්තර දෙන්ට කෙනෙක් හිටියේ නැහැ. අන් හිම ගොඩවල් පැත්තෙන් අඳුරත් වැටිගෙන එනවා.

අම්මා ගේ ඇතුළට දුවගෙන ඇවිත් කොක්කේ එල්ලා තිබුණු කුවක්කුව ගත්තා. පතරොමදා අරගත්තා, ලන්තෑරුමත් අතට අර ගෙන වුක්ට උත් තැනින් හෙල්ලෙන්ටු එපා කියලා මිදුල දිහාට දිව්වා.

දවස් හතරක් කිස්සේ එතන හිටලා තිබුනු පා සටහන් බොහොමයි. ගෙක්ව හොයන්නේ කොහොමද කියලා අම්මට තේරෙන්නේ නෑ. ගෙක් බය නැතුව තනියම කැලේ පැත්තට යයි කියලා අම්මා හිතුවේ නෑ, එත් අම්මා පාර දිහාවට දිව්වා.

පාරේද කවුරුවත් නෑ. එයා කුවක්කුවට පතරොම් දමා වෙඩිල් ලක් තිබ්බා ඇහුම්කන් දුන්නා ආයෙත් දෙසරයක් වෙඩි තිබ්බා.

එක පාරටම බොහොම ලඟින් 'පිළිකුරු වෙඩිල්ලක්' ඇහුණා කවුදෝ කෙනෙක් එයාට දැඩි කරන්ට අවශ්‍ය වෙනවා. එක එක්ක හම්බවෙන්ට ඉදිරියට දුවගෙන යන්ට අම්මාට හිතුනා. නමුත් එයාගේ කකුල් හිම ගොඩේ එරුණා. ළන්තෑරුම හිම ගොඩ උඩ වැටිලා බිඳුණා. නිම්ලා ගියා.

ගේ පැත්තෙන් යටි ගිරියෙන් කෑගහන අඬක් ඇසුණා. ඒ කෑගැහුවේ වුක් ටෙඩි ශබ්දය ඇහිලා එයා හිතුවේ මෙහෙමයි: දුන් මිනයෝ ගෙක්ව මරලා කාලා ඉවරයි. දුන් උන් අම්මාවත් රෙන්ව ඇවිත් තියලා.

අම්මා ළන්තෑරුම අහකට විසිකලා; හකි දමාගින් ගෙට දිව්වා. උණුසුට ඇදුම් නැතුව සිටි වුක් ගේ ඇතුලට තල්ලු කලා; කුටක්කුව-මුල්ලකට විසිකළා; ගුරුලේත්තුව ඇරලා සීතල වතුර ටිකක් බීගෙන ගියා.

දෙර පැත්තෙන් ගොරවන හඬකුයි; මොකක්ද හැප්පෙන සද්දය කුයි ඇහුනා; ගේ ඇතුලට බල්ලෙක් දුවගෙන ආවා. ඌට උස්සෙන් මුරකාරය ආවා. එයා වහාම දුම් දමනවා වගේ ඩාප්ප පිට වෙනවා.

''මොකද කරදමේ? වෙඩි තිබ්බේ මොකද?'' එයා හිම ඇදුම් පිටින්ම ඉඳගෙන ගරුහරු නැතිවම ඇහුවා. ''ළමයා නැතිවෙලා',යි අම්මා කිව්වා. එයට වඩා වටිනායක්වත් එයාට කියන්ට බැරිවුණා, වැස්සක් වහිනවා වගේ ඇගේ ඇස්වලින් කදුළු කඩා හැලෙන්ට පටන් ගත්තා.

''ඔහොම ඉන්න. අඬන්නේ නැතිව ඉන්න. කොයිවෙලාවේ ඉඳලද නැත්තේ? හුහක් වෙලා ඉඳලද? නැත්නම් වැඩි වෙලාවක් නැද්ද? නිර්භීතයා හැරියන් ආපහු.'' එයා බල්ලාටයි මෙහෙම කිව්වේ. ''කණා කරන්න. නැත්නම් මම ආපහු යනවා''

''පැයක් විතර ඇති. වතුර ගේන්ට ගියා. එනකොට එයා නෑ. ඉණා හිම ඇදුනුත් ඇඳගෙන කොහෙද ගිහින්.

''පැයෙකට එයාට එච්චර ඇත යන්ට බෑ. හිම කඩා. හිම සපත්තු ඇඳගෙන නිසා ඉක්මනට සීතල හැදෙන්නේ නැහැ. මා ලහට වර නිර්භීතයා. මෙන්න ඉව කරපිය!''

මුරකාරයා ඇණයක ඵල්ලා තිබුණු ගෙක්ගේ රබර් සපත්තුවක් ඇදලා අරගෙන බල්ලාගේ නාසයට ඇල්ලුවා,

බල්ලා වුවමනාවෙන්ම ගෙක්ගේ දේවල් ඉවකර බලා උගේ ස්වාමියා දිහා මනුස්සයෙක් වගේ කල්පනාවෙන් බැලුවා.

''මා එක්ක වර'' කියමින් එයා දෙර හයියෙන් ඇරියා ''නිර්භීතයා හොයපිය, හොයාගෙන වර.''

බල්ලා වල්ගය වන වින එකනම උන්නා,

''පලයන් නිර්භීතයා. හොයන්ඕ පලයන්''යි ආයේ මුරකාරයා කීවා.

බල්ලා ඉවසිල්ලක් නැතුව නාසය අතුල අතුල ඉවකළා. අනේ මාරු කරකර එකනම හිටියා

''ඉතින් නැටුමක් පටන්ගත්තා!'' කරහගිය මුරකාරයා කිව්වා ගෙක්ගේ සපත්තුවත් තොප්පියක් බල්ලාගේ නාසයට ආයෙත් ලං කරලා උගේ කරපටියෙන් ඇද්ද.

ඒ වුනත් 'නිර්භීතයා' මුරකාරයා පස්සෙන් ගියේ නැහැ. ඌ එනකම කැරකි කැරකි හිටියා. ටිට පස්සේ ආපහු හැරියා දෙරට එහා ඇත්තේ ගෙයි මුල්ලකට ගියා.

මෙතනට ඇවිත් ඌ එනන තිබුණු ලොකු ලී පෙට්ටිය ලඟ නතර වුණා, උගේ දිග ලොම් තියෙන අතින් පෙට්ටිය පහුරු ගැවා, උගේ හාම්පුතා පැත්තට හැරිලා තුන් වරක් බිරුවා.

එතකොට මුරකාරයා බයෙන් කිසිත් කරගන්ට බැරි තත්වයක ඕටී අම්මා අතට තුවක්කුව දීලා ලී පෙට්ටිය ලඟට ගිහින් ඒකේ පියන් පක ඇරියා.

පෙට්ටිය ඇතුලේ, ගෙ'නි, බැටලු හම් තවත් නොයෙක් විදිහේ දේවල් ගොඩ කරලා තිබුණු තැනට වෙලා එයාගේ පුංචි හිම කබාය පොරවාගෙන, හිම තොප්පිය ඔලුවට කියාගෙන ගෙක් හොඳටම නිදි!

එයා ඇහැරවලා, ලී පෙට්ටියෙන් බස්සවපු වෙලාවේ එයා නිදි මත ඇස්වලින් වටපිට බැලුවා. මෙච්චර ගෝසාවකුත් ප්‍රීකියකුත් ඇතිවුණේ කොහොමද කියලා එයාට තේරුණේ නෑ. අම්මා එයාව සිඹ සිඹ අඬන්ට වුණා. චුක් එයාගේ අත්පාවලින් අදිමින් කෑගැහුවා,

"ඒයි ලිසා! ඒයි ලිසා!" කියලා.

චුක් 'නිර්බීතයා' කියන බුල් දීග බල්ලාගේ හොම්බ ඉම්බා. පුදුමයට පත්වුණා වගේ ඉවකට හැරුනු ඌටක් වෙච්ච කිසිම දෙයක් තේරුණේ නෑ. හෙමින් හෙමින් උගේ අලුපාට වල්ගය වනවන මේසය උඩ තිබුණු පාන් කැල්ලක් දිහා හුරතල් විදිහකට බැලුවා.

සිද්ද වෙලා තියෙන්නේ මෙහෙයි:—

අම්මා චුක් එක්ක වතුර ගේන්ට ගිය වෙලාවේ ගෙක්ට කම්මැලි ශබ්දයක් දුනිලා, එයා කවට කමක් කරන්ට හිතා ගත්තා. එයා හිම කබාය ඇඳගෙන තොප්පියද දාගෙන පෙට්ටිය ඇතුලට ටිංගලා හැංගුනා අම්මයි අයියයි ඇවිත් එයාව හොයන කොට ඒ ගොල්ලෝ බයවෙන තරම් හයියෙන් කෑගහන්ඩ හිතා ගත්තා. අම්මයි අයියයි පම්බුන නිසා එයාට එතන ඉඳලා ඉඳලා අන්තිමට ඉඩේම නිස්ද ගියා.

ඒ වෙලාවේ නැගිට මේසය ලඟට ආ මුරකාරයා, තිර යතුරකුයි පොඩිවී ගිය ලියුම් කවරයකුයි මේසය උඩට විසි කළා,

"මෙන්න භූගර්භ විද්‍යා පර්යේෂණ කඳවුරේ නායක සිරේගින් ලියුමක් දුන්නා. 'මෙන්න ගඩා කාමරේ යතුර. එයා තව දවස් හතරකින් අනිත් කට්ටියත් එක්ක එනවා. ඒ කියන්නේ හරියටම අළුත් අවුරුද්ද දට"

බැලු බැල්මට සැඩ පරුෂ කෙනෙක් වගේ පෙනෙන මේ මහලු මනුස්සයා ගියේ කොහොමද කියලා එක පැහැදිලි වුණේ දනුයි. දඩ යමේ යනවා කියලා එයා ගිහින් තියෙන්නේ අර්කාප් මිටියාවතට චුක් සහ ශෙක්ගේ කාත්තා හම්බ වෙන්ට!

අම්මා ලියුම කඩා බලන්නේවත් නැතිව ඒ වයසක මනුස්සයා ලඟට ගිහින් එයාගේ උරහිසින් අත තියලා ස්තුති කළා.

එයා ඒකට පිළිතුරක් වශයෙන් කිසිම දෙයක් කීවේ නැහැ. ලී පෙට්ටිය ඇතුලේ හැංගීම ගැන ගෙක්ට මහ හයියෙන් බැන්නා ලන් තැරැමේ චිත්තිය බිත්ද කියලා අම්මාට දෙස් කිව්වා. එයා බොහොම වෙලා. බොහොම ඕනෑකමින් මොනවද කියමින් කෑගැහුවා. ඒත් දැන් ඒ නොඳ හිතක් ඇති කලබලකාරයාට කවුරුවත් බය වුණේ නෑ. අම්මා එදා මුළු දවසෙම ගෙක් ලංකර ගෙන හිටියා. එයා ආයෙත් නැතිවෙයි කියලා බියෙන් හංගේ වැඩි වෙලාවක් ගෙක්ගේ අතින් අල්ලා ගෙනයි හිටියේ. එදා අම්මා ගෙක්ට කොයිතරම් ආදර සැලකිලි දැක්කුවද කියනව නම් වුක් ටිකක් අමනාප වුනා. එයාටත් පෙට්ටිය ඇතුලේ හැංගෙන්ට බැරිවීම ගැන කිප වෙක්ම කණගාටු වුනා.

දැන් ඉතින් කාටත් සන්තෝසයි. ඊලඟ දවසේ උදේ මුරකාරයා ප්ගොල්ලන්ගේ කාක්කා ඉන්න කාමරේ දොර ඇරියා. කාමරේ ලොකුයි. හොඳට එළියයි. ඒත් ඒක ඇතුලේ කියෙන හැම දෙයක්ම අවුල්ගටලා.

අම්මා ඒ වෙලාවෙම කාමරේ සුද්ද පවිත්‍ර කරන්නට පටන්ගත්තා; එයා මුළු දවසෙම බඩු අස්කලා: ගේ අතුගෑවා: බීම හේදුවා.

හවස දර මිටියකුත් අරගෙන ආ මුරකාරයා කාමරයේ වෙනස් වීමයි, වෙනදු දැකලා නැති විදිහේ පිරිසිදු කමයි දැකලා පුදුම වුනා. එයා ඊට පස්සේ කාමරයේ එළිපත්තෙන් එහාට අඩිය තිබ්බේ නෑ.

ඒත් 'නිර්බිතයා' කියන බල්ලා නම් කෙලින්ම කාමරය ඇතුලට ගියා. ඌ ගෙක් ලහට ගිහින් ඌගේ සිතල කොම්බෙන් එයාව ඉව කළා. ....."මෙන්න අර මෝඩයා මමයි උඹව හොයාගත්තේ! ඒ හින්ද උඹ මට කන්ඩ මොනවාහරි දෙන්ඩ ඕනා" කියනවා වගේ

අම්මාට ඌ ගැන ආදරයක් හිතිලා ඌ ලහට කල්බසා කැල්ලක් විසිකළා. එතකොට මුරකාරය කෑගහල මෙහෙම කිවා:-"බල්ලන්ම තයිගා වනාන්තරේදී කල්බසා දීම කවුඩන්වූක් හිනා වෙන්ට කාරණ යක්."

අම්මා මුරකාරයාටද කල්බසා කැල්ලක් ඇපා දුන්නා. එයා ස්තුති කරම්න්ඒකත් අතට අරගෙන මොකක්ද කාරණයකට පුදුම වුනා වගේ හිස වනා වනා යන්ට ගියා,

ඊලඟ දවසේ අප්පච් අවුරුද්ද වෙනුවෙන් 'කසගහ'[1] සරසන්ටයි ඒගොල්ල තීරණය කරගෙන තිබුණේ. කසගගේ එල්ලීමට විසිතුරු සෙල්ලම් බඩු සාදන්ට ඔවුන් භාවිතා නොකරපු දෙයක් තිබුණද! ඒක මට කියන්ට අමාරුයි,

ඒ ගොල්ලො පරණ සහරාවලින් පාට පින්තූර කපා ගත්තා පාන්කඩයි කපු පුළුන්යි අරගෙන සතුන්ගේ රූප හැදුවා. තාත්තාගේ ලාච්චුවේ තිබුනු සිගරට් පැකැට්ටවල සරුව පිත්තල කොළවලින් ලස්ලන මල් හැදුවා.

මුරකාරයා මුලදී මේවා ගැන උනන්දුවක් පෙන්නුවේ නෑ. ඒත් පස්සේ දර අරගෙන ආපු වෙලාවේ ඒ ගොල්ලෝ කරල තියෙන අප්පච් අප්පච් වැඩ දැකලා පුදුම වුණා. අන්තිමට එයාටත් මේ වැඩ ගැන ආසාවක් හිතිලා තේ පැකැට්ටුවකට සරුවපිත්තල කොලයකුයි. සපත්තු බප දැමීමට එයා පාවිච්චි කළ ඉටිකැබෙල්ලකුයි ගෙනත් දුන්නා.

ඒක ලැබුණු එක අගෙයි! ඒ වෙලාවෙම ඒ ගොල්ලන්ගේ සෙල්ලම් බඩු කර්මාන්ත ශාලාව ඉරිපන්දම් වැඩපොලක් බවට පත්වුණා ඒගොල්ලෝ කැපූ ඉටිපන්දම් එව්වර ලස්සන නෑ. ගොරෝසුයි. ඒත් කඩෙන් ගන්නා ලස්සන ඉටිපන්දම් වාගේම ඒවාත් එළියයි.

දැන් කරන්ට තියෙන්නේ කසගහක් මහායා ගැනීමයි. අම්මා මුරකාරයාගෙන් පොරව ඉල්ලුවා. ඒත් එයා ඒකට උත්තරයක් නොදී ගිම ලිපතුරු වලව නැගී කැලේට ගියා.

පැය බාගයකට විතර පස්සේ එයා ආපහු ආවා.

දැන් හැම දෙයක්ම සූදානම් කසගගේ එල්ලූ රූප එව්වර විසිතුරු නොවුනත්, පාංකඩ වලින් හැදූ හාවුන්ගේ රූප ටිකක් බලල්ලු වගේ පෙනුන, ඒගොල්ලෝ හැදූ රුකඩ පැකිලි ඒවා වුණත්, සරුවපිත්තල කොළවල එතු යෝල්කා ගෙඩි කඩෙන් ගත්ත බිදෙනසුළු වීදුරුබෝල තරම් දිලිසුණේ නැතත් මේවාගේ අප්පච් අවුරුදු කසගහක් මොස්කව් නුඹර කාටවත් තිබුණේ නෑ. ඒක ගණ අතු පතර ඇති අග්ගිස්ස කාරකා වල හැඩයට කොළ විහිදී ගිය කදිම කසගහක්! ඒක නියම කයිනා රූප රාජිනියක්.

---

[1] රුසියාවේ මිනිස්සු කසගහ කියන්නේ නත්තල් ගහට.

හුහක් වැඩ තිබුණු නිසා දවස් හතර නොදනුවත්වම ගත වුණා. දුන් පරණ අපුරුද්ද ගෙවී යාමේ කාලයක් ඇවිත්. උදේ ඉඳලා මග බල බලා හිටිය පුක් සහ ගෙක් ඉගට යවන්ට කාවවත් බැරි වුණා. සීතලෙන් හිරිවැටී නිල්පාටවූ නාස් ඇතිව ඒ ගොල්ලෝ මෙහෙම එලී මහනේ හිටියේ දුන් දුන් තාත්තා සෙතගත් සමග කැලෙන් මකුවෙයි කියා බලාපොරොත්තුවෙන්.

ඒ වේලාවේ නැමට වතුර උණුකරමින් සිටි මුරකාරයා ළමයින්ට කීවා නීකරුණේ සීතලේ නොයිඳ ගෙට යන්ට කියා:—

"ඒගොල්ලෝ දවල් කෑම ගන්න වෙලාවට කලින් එන්නේ නෑ.

ඒ ඇත්තයි ඒගොල්ලෝ දවල් කෑමට ඉඳගන්න කොටම මුර කාරයා ජනේලයට තට්ටු කළා. කොහොම කොහොම හරි හනික ගිම ඇදුම් ඇඳගෙන අම්මයි ළමයි දෙන්නයි ගේ දොරකඩට ආවා.

"දුන් බලන්න කම්පිය දුන් අර විශාල කන්දට දකුණෙන් තියෙන කදු ඕවුමේ ලිස්සාගෙන එනවා පෙනෙයි. ඒගොල්ලෝ ආයෙත් තෂිගෑ වහාන්තරය හරහා එනවා. තව පැය බාගයකින් හැම දෙනාම ගෙදර" මුරකාරයා කීවා.

එයා කියාපු විදිහට සිද්ද වුණා.

පළවුමෙන් කදු කපොල්ල අතරින් බල්ලන් බැඳපු හිම කරත්ත ගණනාවක් පෙනෙන්ට වුණා. ඊට පස්සේ හිම ලී පතුරුවලින් වේග යෙන් එන මිනිස්සු පෙනෙන්ට පටන් ගත්තා. මහා විශාල කන්දේ ප්‍රමාණය අනුව ඒගොල්ලෝ පෙනුනේ හිනායන කරම් පුංචියට ඒත් ඒ ගොල්ලන්ගේ අන්පා ඔලුව හෙම පැහැදිලිව පෙණුනා.

හරියටම පැය බාගයකට පස්සේ බල්ලන් බුරනා හඬත් මිනිස්සු කෑගහන හඬක් ඇසුණා.

දොරකඩ සිටිය පුක්, ගෙක් සහ අම්මා දැකපු මිනිස්සු අතේ තිබුණු කෝපු වනමින් මහ හඬින් "හුර්රා! හුර්රා!" කියා කෑගැවා.

ඒ වේලාවේදී දොරකඩ සිටි වුක්ට ඉවසිල්ලක් නැතිව ගිහින් පඩි පෙලෙන් මිදුලට බැහැලා රෑවුලක් තියන උස මිනිහෙක් ගාවට දිව්වා.

[illegible] කියලා කැඟැවේ එයයි. (එයා කමා [illegible]

දවල් කෑමෙදෑ ඒගොල්ල රැවුල් කැපුවා, නෑවා, සුද්ද පවිත්‍ර වුණා. හවස සියල්ලන්ටම සතුටුවන්ට 'කසගහ' සූදනම් කරලා තිබුණා සියල්ලෝම සතුටින් මිත්‍ර ලීලාවෙන් අළුත් අවුරුදු උදුව ගතකළා.

වුක් සහ ගෙක් හැරෙන්ට අනිත් සියලුම දෙනා වැඩිහිටියෝ නිසා ඒ වෙලාවේ කරන්ට දෙයක් නිතාගන්ට බැරිවුණා

වාසනාවකට වගේ එක්කෙනෙක් ලඟ සර්පිනාවක් තිබුණා. එයා මිහිරි නැටුම් කාලයක් වාදනය කළා. හැම දෙනාම බොහොම අපූරුවට නැටුවා. අවමත් සහභාගි වුණාම නැටුම වඩාත් අලංකාර වුණා.

තාත්තා නවන්ට දන්නේ නෑ. එයා බොහොම් සක්තිමත් කරුණාවන්ත කෙනෙක්. මොකම විදිහේ නැටීමකට වත් යහඟාගිනොවී එයා කාමරේ එහාට මෙහාට යන වෙලාවට අල්මාරියේ තිබුණු පිහන් සෙලවුණා.[1] එයාට එච්චරටම සවි සත්තියක් තියෙනවා.

තාත්තා වුක් සහ ගෙක් උකුල උඩ තියා ගත්තා. හැම දෙනාම අන්පොලසන් දෙන්ට පටන්ගත්තා,

දන් නැටුම් අවසානයි. මිනිස්සු ගෙක්ට සින්දුවක් කියන්ට ආරාධනය කළා. ගෙක් අදි මදි කෙල්ල නෑ. එයා දනගත්ත ගීතය සින්දු කියන්ට පුළුවන් බව.

එයා තමන්ගේ ඒ අත්දකම ගැන ආඩම්බර වුණා.

ඉතින් ඇකෝඩියන් එක නාද වුනා. එයා ගායනා කලා

එයා ගායනා කළ ගීතය මොකක්ද කියලා මට මතක නෑ. එක ඉක්මන් හොඳ ගියක් බව පමණක් මට කියන්ට පුළුවනි. ඒ ඇයිද කියනවා නම් සියලු දෙනාම ඒක ඇහෙන කොට නිශ්ශබ්ද වුණා.

---

[1] රුසියාවේ බොහෝ විට ගෙවල්වල බිම්ට ලී පතුරු සවිකර තිබෙනවා.

ගෙක් හුස්ම ගන්ට නතර වෙන කොට ජනේලය ළඟ පුරවාගත්ත හුළං ගහන හඬක් ඉටිසන්දට වල ඉටි තිත්තු ටැවෙන හඬ් වැහුණා.

ගෙක් ගිය කියලා අවසාන වුණාම හැම දෙනාම ප්‍රීතිරයන් ගෝසා කළා. එක්කෙනෙක් ගෙක්ව උඩ වීසි කර ඇල්ලුවා. තව කෙනෙක් එහෙම කළා. අනිත් අයත් එහෙම කරන්ට පටන් ගත්තා, අම්මා ගෙක්ව ඒගොල්ලන්ගෙන් උදුරා ගත්තේ එයා ඕලිමේ වැදෙයි කියල බයෙක්.

තාත්තා ඔර්ලෝසුව දිහා බලලා කිව්වා "දැන් ඉතින් කවුරුත් ටාඩී වෙමු" කියලා දැන් කමා වැදගත්ම වැඩේ පටන්ගන්ට යන්නේ. එයා ගිහින් රේඩියෝව කැරකෙව්වා.

මුලින්ම නිශ්වල නාවයක්! ඊලඟට නොයෙක් විදිහේ ගෝසාවල්ා ඔන්න ඉකින් කොහේදෝ ඇත ඉඳලා ඕහිරි සිනු හඬක් ඇසෙන්ට පටන් ගත්තා.

ඒ ලොකු කුඩා සීනු වැදුනේ මෙන්න මෙහෙමයි.

"තිර්-ලිල්-ලිල්-ඩොං!
තිර්-ලිල්-ලිල්-ඩොං!

ඩුක් ගෙක් දෙන්නා මේ නාදය ඇහිලා මූණින් පුණ බලාගත්තා. ඔවුන්ව හිතා ගන්ට පුළුවන් වුණා මොකක්ද, ඒ හඬ කියලා. ඒ ක්‍රෙම්ලින් මන්දිරේ කොන අග රතු තාරකාව කියන කුලුණේ ඇති රත්රන් ඔර්ලෝසුව වැදෙන හඬ.

අලුත් අවුරුද්ද දවසේ ඒ හඬ නගරවලද, ඝඳුකරවලද, ස්ටැප්ස් කණ හුම්යේද, තයිගා වනාන්තරයේද, ඝලු මුහුදු වෙරලේද සිටිනා සියළු දෙනාට ඇහුණා.

සතුරාට පහර දීමට වොරම් ලෝප්ගේ ආඥාව එනතුරු කෝච්චිය ලඟ කල්පනා කරකර හිටි හමුදා නායකයාටද මේ සීනු හඬ ඇසෙන්ට ඇති!

එතකොටම් හැමෝම නැගිටලා එක එක්කනාට ,,සුබ අළුත් අවුරුද්දක් වේවා! කියලා පැතුවා, හැම දෙනාටම වාසනාව උදාවේවා! කියලා ආයිරි පැතුවා'

වාසනාව කියන්නේ මොකක්ද? එක එක්කෙනා තමන්ට කැමති විදියට තේරුම ගන්න දෙයක්. ඒත් හැම දෙනාම අවංක ජීවිතයක් ගත කරන්ට ඕනෑ බවත් මැලිකම් දුරලාවැඩකල යුතු බවත් විශ්වාසවුද, වාසනාවන්ත වූද, සෝචියට් දේශය කියන තමන්ගේ රටට ඔබාහොම ආදරය කරන්ට ඕනෑ බවත් අනගත්තා, තේරුම් ගත්තා:

—නිමි—

සෝවියට් ළමා සාහිත්‍ය යෙහි මහා ග්‍රන්ථකාරයා ලෙස සැළකෙන අර්කාදි ගයිදර්ගේ 'චුක් සහ ගෙක්' නමැති මෙම ළමා කතාව ලෝකයේ බොහෝ රටවල විවිධ භාෂාවලින් පළ වී ඇත. ළමයින් මහත් ඇල්මක් දක්වන මෙම ළමා කථාව සිංහළට පරිවර්තනය කර ඇත්තේ රුසියන් භාෂා විශාරදයකු වන තෙන්නකෝන් ජයසුමන විසිනි.

රු. 12/-

ඔතුර මුද්‍රණ - 3 ආනන්ද මෛත්‍රිය මාවත - මහරගම